**බස්නාහිර පළාත් සභාව - 2022 වර්ෂය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

බස්නාහිර පළාත් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2023 ජූලි 11 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූලි 21 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | 2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 26 ක මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.17,837,594,303 ක් වුවද එකී වටිනාකම 2022 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂයන් ලෙස සටහන් කිරීමේදී රු.27,510,670,605 ක් ලෙස වටිනාකම රු.9,673,076,302 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මීට පෙර Excel Sheet මඟින් ගිණුම්ගත කර තිබූ වත්කම් අගයන් ඉවත් කර සිගාස් වැඩසටහන මඟින් ඇතුළත් කළ නව අගයන් ආරම්භක ශේෂ ලෙස ගිණුම්ගත කර ඉදිරියට ගෙන ඒම හේතුවෙන් වෙනස්කම් සිදුවී තිබෙන බව. | පසුගිය වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂයේ වටිනාකම ප්‍රවර්ථන වර්ෂයේ ජනවාරි 01 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂයේ වටිනාකමට සමාන විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලසීමාව තුළ මාර්ග සංවර්ධන අධිකාරිය(බ.ප.) හා තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය(බ.ප.) යන ආයතන 02 හරහා ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කර ඉංජිනේරු කාර්යාංශය විසින් මිලදීගෙන තිබූ රු.528,985,774 ක් වටිනාකමැති මූල්‍ය නොවන වත්කම්ද රු.28,998,824 ක් වටිනා තොරතුරු තාක්ෂණ උපකරණද, ඉංජිනේරු කාර්යාංශයේ හෝ එකී වත්කම් මාරු කිරීම් මගින් ලබාදුන් ආයතන විසින් සමාලෝචිත වර්ෂය අවසානය වනවිටද මුළු වටිනාකම ගිණුම්ගත කළ බවට පැහැදිලි තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | එම වත්කම් නිසි පරිදි ලේඛනගත කරන බවට හා ගිණුම්ගත කරන බවට තහවුරුවක් අදාළ ආයතන වෙතින් ලබා ගැනීමට ලිපි නිකුත් කර ඇති අතර මේ වනවිට ඒ අනුව කටයුතු කරමින් පවතින බව. | මිලදී ගන්නා ලද සියළු මූල්‍ය නොවන වත්කම් හා තොරතුරු තාක්ෂණ උපකරණ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඇතුළු ආයතන 14 ක රු.1,943,221,441 ක් වටිනාකමැති මූල්‍ය නොවන වත්කම් එම ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබූ අතර ඒ අනුව පළාත් අරමුදලේ මූල්‍ය නොවන වත්කම් වටිනාකම හා දේපළ, පිරියත හා උපකරණ සංචිත අරමුදල එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂය අවසන්වීමට ප්‍රථම අපේක්ෂිත පරිදි මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කර අවසන් කිරීමට නොහැකි වූ බව. | සියළු මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | පළාත් මාර්ග අමාත්‍යාංශය සතු වාහන 07 ක් රු.41,350,000 කටද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සතු වාහන 40 ක් රු.147,550,000 කටද තක්සේරු කර තිබුණද වාහනවල වටිනාකම පිළිවෙලින් රු.28,400,562 ක් හා රු.58,715,000 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් පළාත් මාර්ග අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් රු.12,949,438 ක් අඩුවෙන්ද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මූල්‍ය නොවන වත්කම් රු.88,835,000 ක් අඩුවෙන්ද දක්වා තිබුණි. | 2023 වර්ෂයේදී නිවැරදි කරන බව. | සියළු මූල්‍ය නොවන වත්කම්වල නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් සභා නිලධාරීන්ගේ අත්තිකාරම් පාලන ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.62,634,791 ක් වුවද එදිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.56,679,725 ක් වීමෙන් ශේෂයන් අතර රු.5,955,066 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී මෙය නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | ගිණුම් ශේෂ සසඳා නිවැරදි ශේෂය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | අරමුදල් ගිණුම අනුව සමාලෝචිත වර්ෂයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා වැයකර තිබූ වටිනාකම රු.1,814,283,986 ක් වුවද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල මූල්‍ය ප්‍රකාශන අනුව මූලධන වත්කම් මිලදී ගැනීම් | මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා දරා තිබූ වියදමට අදාළව මිලදී ගැනීම් යටතේ දක්වා ඇති වටිනාකමට සමාන කිරීමට සිගාස් | ගිණුම් ශේෂ සසඳා නිවැරදි ශේෂය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වටිනාකම රු.270,672,300 ක් වූයෙන් රු.1,543,611,686 ක වෙනසක් පැවතුණි. | වැඩසටහන මගින් සෘජු වාර්තාවක් ලබා ගැනීමට නොහැකි බව. | |
| (උ) | පළාත් පාලන අමාත්‍යාංශයේ පළාත් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව සමාලෝචිත වර්ෂයේ අංක 104-3-2-2104 දරන වැය විෂයය යටතේ ගොඩනැගිලි හා ඉදිකිරීම් සඳහා වූ වියදම රු.36,831,873 ක් වුවද, විසර්ජන ගිණුමේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ රු.12,843,962 ක් ලෙස දක්වා තිබීමෙන් රු.23,987,911 ක වෙනසක් පැවතුණි. | 2023 ජුනි මස ගිණුම් සාරාංශය මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ සසඳා නිවැරදි ශේෂය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | පළාත් ඉංජිනේරු කාර්යාංශයේ ශේෂ පිරික්සුම හා විසර්ජන ගිණුම අතර ගොඩනැගිලි ශේෂයේ රු.656,246 ක වෙනසක්ද, නොනිමි වැඩ ශේෂයේ රු.2,788,545 ක වෙනසක්ද පැවතුණි. | උප කාර්යාලවල ගිණුම් සාරාංශයන්හි පවතින දෝෂයන් නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | ගිණුම් ශේෂ සසඳා නිවැරදි ශේෂය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය 100 - ආණ්ඩුකාරවරයා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය රාජගිරිය ජනජය සිටි ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීමට අදාළව මිලදී ගැනීම සඳහා 2018 දෙසැම්බර් 31 දිනට ආණ්ඩුකාරවර කාර්යාලය විසින් කෝට්ටේ මහා නගර සභාවට ගෙවූ රු.256,966,831 ක මුදල විධිමත් ලෙස ගිණුම්ගත කිරීමකින් තොරව 2018 වර්ෂයේ වියදමක් ලෙස පමණක් දක්වා තිබුණි. | 2023 වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. | කාර්යාලය සතු සියළු මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ජනාධිපති ලේකම්ගේ අංක PS/CSA/11-18 දරන හා 2018 ඔක්තෝබර් 12 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාර ගරු ආණ්ඩුකාරවරුන්ගේ පරිහරණය වෙනුවෙන් වෙන් කරනු ලබන උපරිම නිල වාහන සංඛ්‍යාව 02 ක් හා අවශ්‍ය | පළාත් පාලන අමාත්‍යාංශයෙන් (බ.ප.) තාවකාලිකව අනුයුක්ත කරන ලද මෝටර් රථය ආණ්ඩුකාරතුමා විසින් යොදාගනු ලබන්නේ විශේෂ උත්සව සඳහා | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වන්නේ නම් ආරක්ෂක කටයුතු වෙනුවෙන් එක් ආරක්ෂක රථයක්ද හිමි වුවත්, බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමාට ආරක්ෂක රථයක්ද ඇතුළුව නිල වාහන 04 ක් වෙන්කරදී පරිහරණයට යොදවා තිබුණි. | පමණක් වන අතර අමතර ඉන්ධන ලබාදීමක් සිදු නොවේ. | |
| (ඇ) | කිසිදු චක්‍රලේඛයකින් ප්‍රතිපාදන සලසාදී නොතිබුණද 2019 වර්ෂයේ මැයි මස සිට 2022 දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ආණ්ඩුකාර නිල නිවස පරිහරණය කළ ආණ්ඩුකාරවරුන් පරිභෝජනය කළ විදුලි හා ජල ඒකක ප්‍රමාණය අනුව ඔවුන් විසින් ගෙවිය යුතු රු.1,206,653 ක විදුලි බිල්පත් හා රු.217,854 ක ජල බිල්පත් ආණ්ඩුකාරවර කාර්යාලය විසින් ගෙවා තිබුණි. | 2019 වර්ෂයේ සිට එම නිල නිවස භාවිතා කරන ලද කිසිදු ආණ්ඩුකාරවරයෙකුගෙන් ජල හා විදුලි බිල්පත් සඳහා අය කිරීමක් මෙයට පූර්වයෙන් සිදුවී නොමැති බව. | නිල නිවාස පරිහරණය කරනු ලබන ආණ්ඩුකාරවරුන් විසින් විදුලි හා ජල බිල්පත් ගෙවීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ශීර්ෂය 101 - සභා ලේකම් කාර්යාලය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගණකාධිපති වාර්තාවල සඳහන් කරුණු පිළිබඳව විමසා බැලීමටත් ඒ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව අදාළ ආයතන දැනුවත් කිරීමත්, පසු විපරම් කටයුතු සිදු කිරීමටත් "මූල්‍ය හා කාර්යසාධන වාර්තා සමාලෝචන කමිටුව" නමින් කමිටුවක් පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත පිහිටුවා එම කමිටුව සඳහා සාමාන්‍ය රාජකාරි වේලාව තුළම රැස්වී තිබූ අතර කමිටුව වෙනුවෙන් 2021 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානයට රු.2,802,678 ක් වැයකර තිබුණි. නමුත් 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන පළාත් සභා ප්‍රධාන ලේකම්වරු ඇමතූ ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාර ආයතන මට්ටමින් සිදු කරනු ලබන විවිධ දීමනා ගෙවීම අත්හිටුවීම සිදුකළ යුතු බව සඳහන් වුවද ඉහත කමිටුව සඳහා 2023 අප්‍රේල් වනවිටත් එම දීමනා ගෙවමින් පැවතුණි. | ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ප්‍රකාරව මෙම දීමනා ගෙවීම සිදුකර ඇත. | දීමනා ගෙවීම් සඳහා ජාතික වැටුප් හා සේවක කොමිෂන් සභාවේ හා මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව හෝ රජයට අයත් අමාත්‍යාංශයක හෝ ආයතනයක මැදිහත්වීමකින් හෝ ඉල්ලීමකින් තොරව බස්නාහිර පළාත් සභාවට සෘජු සම්බන්ධයක් නොමැති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති වෙත ඔහුගේ පෞද්ගලික ඉල්ලීමක් පදනම් කරගනිමින් රු.27,250,000 ක් වටිනා ප්‍රාඩෝ ජීප් රථයක් පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත ලබාදී තිබූ අතර එහි 2021 දෙසැම්බර් 07 දින සිට 2023 දෙසැම්බර් 29 දින දක්වා වන කාලයට අදාළ රක්ෂණාවරණය වූ රු.557,770 ක් සහා ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණි. | ආණ්ඩුකාරතුමාගේ නියමය සහ අනුමැතිය පරිදි ගෙවා ඇත. | පළාත් සභාව සතුව පවතින වාහන ගෙන්වා ගැනීමට හා වාහනය භාවිතයට ගන්නා පාර්ශවය විසින් වාහනයට අදාළව සියලු වියදම් දැරිය යුතුය. |
| (ඇ) | 2018 ඔක්තෝබර් 12 දිනැති අංක පීඑස්/සීඑස්ජ්/11-18 දරන ජනාධිපති ලේකම්ගේ රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 2.1 වගන්තිය ප්‍රකාර පළාත් සභා සභාපතිවරුන්ගේ කාර්යාලවල සේවයේ නියුක්ත කරවනු ලබන සහාය කාර්යය මණ්ඩලය 10 දෙනෙකු නොඉක්මවිය යුතු බව දක්වා තිබුණද එම කාර්යය මණ්ඩලය 11 දෙනෙකු දක්වා වැඩිකර වැටුප් හා දීමනා ගෙවා තිබුණි. වැඩිපුර යොදවා තිබුණු රියදුරු තනතුරක් සඳහා 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානයට වැටුප් හා දීමනා වශයෙන් රු.1,694,385 ක් ගෙවීම් කර තිබුණි. | සභාපති තනතුර සඳහා හිමි කාර්යය මණ්ඩලය වෙත පමණක් වැටුප් හා දීමනා ගෙවා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 ඔක්තෝබර් 12 දිනැති අංක පීඑස්/සීඑස්ජ්/11-18 දරන ජනාධිපති ලේකම්ගේ රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභා සභාපතිවරයා සඳහා නිවාස කුලී දීමනාවක් ගෙවීම සඳහා ප්‍රතිපාදන සලසා නොතිබියදී 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා මසකට රු.50,000 බැගින් එකතුව රු.1,650,000 ක නිවාස කුලී දීමනාවක්ද චක්‍රලේඛයේ සඳහන් නොවන සංග්‍රහ දීමනා ලෙස මසකට රු.2,000 බැගින් 2020 වර්ෂයේ සිට 2022 වර්ෂයේ නොවැම්බර් දක්වා රු.62,000 ක්ද ගෙවා තිබුණි. | ආණ්ඩුකාර ලේකම්ගේ අංක 3/6/2/1/15(1වෙළුම) හා 2009 නොවැම්බර් 25 දිනැති අනුමැතිය අනුව ගෙවීම් කරනු ලබයි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | බස්නාහිර පළාත් සභාවේ නිල කාලය 2019 අප්‍රේල් මාසයේ අවසන් වීමෙන් පසු, සභාව අක්‍රියව පැවති 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළදී සභාපතිගේ පෞද්ගලික ලේකම් වෙත අතිකාල දීමනා ලෙස මාසිකව වැටුපට එකතු කර තිබූ රු.2,500 ක දීමනා සඳහා රු.85,000 ක්ද ඇතුළුව අනෙකුත් කාර්ය මණ්ඩලයට අතිකාල දීමනා ලෙස රු.653,159 ක්, ගමන් වියදම් සඳහා රු.689,220 ක් වශයෙන් එකතුව රු.1,427,379 ක් ගෙවා තිබුණි. | 2005 සැප්තැම්බර් 20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 16/2005 අනුව පරිවර්තිත අතිකාල දීමනා ලෙස රු.2,500 බැගින් ගෙවනු ලබන බව දන්වමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව බස්නාහිර පළාත් සභාවේ සහ ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ සියලු දෙනා වෙත 2004 අගෝස්තු 01 දින සිට 2023 අප්‍රේල් වනවිටත් නිලධාරීන්ගේ මූලික වැටුපෙන් 1/3 ක හා 1/4 ක දීමනාවක් ලෙස ගෙවමින් පැවති අතර 2019 අප්‍රේල් 21 දිනෙන් VI වන බස්නාහිර පළාත් සභාවේ නිල කාලය අවසන් වී නව පළාත් සභාවක් තේරී පත්වී නොමැති තත්ත්වයක් යටතේ නිලධාරීන් වෙත ප්‍රමාණවත් වැඩ කොටසක් නොමැති වුවද 2019 අප්‍රේල් සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිලධාරීන්ගේ මූලික වැටුපෙන් 1/4 ක් වන පරිදි ගෙවා තිබුණු මුළු දීමනාව රු.15,085,930 ක් විය. | 2023 මැයි මාසයේ සිට සභා ලේකම් කාර්යාලයේ සියලුම කාර්යය මණ්ඩලයට ¼ දීමනාව ගෙවීම අත්හිටුවීමට කටයුතු කරනු ලැබේ. | අතිරේක දීමනාවක් ගෙවීම සඳහා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ ලබාගත යුතුය. |

### 1.5.3 ශීර්ෂය 102 - පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2007 මැයි 11 දිනැති අංක 2007/09 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 වන වගන්තිය ප්‍රකාර නැවත සේවයේ යොදවනු ලැබූ විශ්‍රාමිකයින්ට විශ්‍රාම වැටුප සමඟ නියමිත ජීවන වියදම් | 2023 ජනවාරි 19 දිනැති ලිපි මඟින් ලිඛිතව දැනුවත් කර ඇති අතර ඒ සඳහා කඩිනම් පිළිතුරක් නොලද | වැඩිපුර ගෙවූ ජීවන වියදම් දීමනාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දීමනාව ලබාදෙන බැවින් නැවත ජීවන වියදම් දීමනාව ගෙවිය නොහැකි නමුත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිලධාරීන් 04 දෙනෙකුට 2010 ජනවාරි 01 දින සිට 2018 ජනවාරි 31 දින දක්වා රු.813,404 ක් ජීවන වියදම් දීමනා ගෙවා තිබුණි. 2023 මාර්තු මාසයේදී එම මුදලින් රු.15,000 ක් පමණක් අයකරගෙන තිබුණි. | හෙයින් 2023 මාර්තු 08 දිනැතිව නැවත සිහි කැඳවීම් ලිපි යොමුකර ඇත. | |
| (ආ) | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විදුලිය, ජලය ඇතුළු ගොඩනැගිලි නඩත්තු වියදම් වශයෙන් රු.24,590,288 ක් සමාලෝචිත වර්ෂයේදී කෝට්ටේ මහා නගර සභාවට ගෙවා තිබුණි. නමුත් බස්නාහිර පළාත් සභාව හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කෝට්ටේ මහා නගර සභාව සමඟ විදුලිය, ජලය ඇතුළු නඩත්තු වියදම් සම්බන්ධයෙන් ගිවිසුම්ගත වී නොතිබුණු අතර ගාස්තු අය කිරීමට අදාළ විධිමත් පදනමක් සඳහන් කිරීමකින් තොරව ඉදිරිපත් කරන ලද බිල්පත් සඳහා කොමිෂන් සභාව ගෙවීම් කර තිබුණි. | කඩිනමින් ගිවිසුම්ගත වීමේ කටයුතු නිම කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව. | විධිමත් ගිවිසුමක් මත ගොඩනැගිලි නඩත්තු වියදම් දැරිය යුතුය. |

**1.5.4 ශීර්ෂය 104 - පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය (බ.ප.)**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන අමාත්‍යාංශය සතු වාහන වසර කීපයක සිට වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත පරිහරණයට ලබාදී තිබූ අතර, එම වාහන ආපසු අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කිරීමෙන් තොරව 2019 මාර්තු මස සිට මූල්‍ය කල්බදු ක්‍රමයට වාහනයක් ලබා ගෙන සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ණය වාරික හා පොලී වෙනුවෙන් රු.11,522,700 ක් වියදම් දරා තිබූ අතර, එයින් සමාලෝචිත වර්ෂයේදී රු.3,072,720 ක් වියදම් දරා තිබුණි. | 2019 මාර්තු මස සිට අමාත්‍යාංශයේ ප්‍රධාන අමාත්‍ය කාර්යය මණ්ඩලය සඳහා රථයක් කල්බදු ක්‍රමය යටතේ ලබාගෙන ඇත. | 2019 අප්‍රේල් මස පළාත් සභාවේ නිල කාලය අවසන්වීමට නියමිතව පැවති හෙයින් මාසයක් හෝ කෙටි කාලයක් සඳහා පමණක් වාහනයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 අප්‍රේල් 21 දින පළාත් සභාවේ නිල කාලය අවසන් වී තිබියදී හා අමාත්‍ය කාර්යාලය සඳහා වෙන් කර තිබූ පරිශ්‍රය වෙනත් පාර්ශවයක් විසින් පරිහරණය කරන තත්ත්වයකදී අමාත්‍ය මණ්ඩලයේ සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවා සඳහා පළාත් පාලන අමාත්‍යාංශයේ 104-3-01-වැඩසටහන මගින් විදුලිය හා ජලය වැය විෂයය යටතේ රු.2,573,000 ක්ද, වෙනත් වැය විෂයය යටතේ රු.5,144,000 ක් වශයෙන් එකතුව රු.7,717,000 ක් වියදම් දරා තිබුණි. | ආණ්ඩුකාරවර කාර්යාලය තාවකාලිකව 10 හා 11 මහලේ ස්ථාපිත කිරීම හේතුවෙන් ඒ සඳහා විදුලිය හා ජලය, ආරක්ෂක සේවා හා සනීපාරක්ෂක සේවා සඳහා ඇස්තමේන්තු සකස් කරනු ලබන්නේ ප්‍රධාන ලේකම් කාර්යාලය වන අතර ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත ප්‍රතිපාදන නිදහස් කරනු ලබයි. | එක් එක් ආයතනයට අදාළ වන වියදම් එම ආයතනයේ වැය විෂයයන් මඟින් ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අයිතිය ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව සතු තක්සේරු වටිනාකම රු.7,000,000 ක්වූ කැබ් රථයක් 2017 අගෝස්තු 31 දින ආණ්ඩුකාර ලේකම්ගේ පෞද්ගලික නිවසේ නවතා තිබියදී ගින්නෙන් සම්පූර්ණයෙන්ම විනාශ වී තිබුණි. මුදල් රෙගුලාසි 104(4) වාර්තාවට අනුව රථය භාර රියදුරා හා රථය පරිහරණය කළ නිලධාරියා වගකිව යුතු පාර්ශවයන් බවට පත්කර තිබුණු අතර රජයේ වත්කම් අවභාවිතා කිරීම හෝ අවභාවිතා කිරීමට ඉඩ සැලසීම මඟින් රජයට ඉහත සඳහන් අලාභය සිදු කිරීමට හෝ සිදුකිරීම වැළැක්වීමට කටයුතු නොකිරීම සම්බන්ධ වගකිව යුතු වාහනය පරිහරණය කළ නිලධාරියා පළාත් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගොස් සිටියද තවදුරටත් කොන්ත්‍රාත් පදනම මත සේවයේ රඳවා ගැනීමට කටයුතු කර තිබුණි. | 104(4) වාර්තාව සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට එරෙහිව බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම් විසින් අභියාචනයක් ඉදිරිපත් කර ඇත. | මුදල් රෙගුලාසි 104 වාර්තාව අනුව කටයුතු කළ යුතුය. |

### 1.5.4.1 බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලය විසින් රු.7,910,000 ක මුදලක් අය කර ගැනීම සම්බන්ධයෙන් මීගමුව දිසා අධිකරණයේදී පවරා තිබූ ඒත්තු කාල වෙරළ උද්‍යානයට අදාළ නඩුව සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර නොතිබුණි. | 2023 මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කිරීමට කටයුතු කරමි. | ආයතනයට අදාළ නඩු සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කළ යුතුය. |
| (ආ) | සංචාරක ප්‍රවර්ධන කටයුතු සඳහා කෙටි වීඩියෝ පටයක් නිර්මාණය කිරීම සඳහා 2018 දෙසැම්බර් 31 දින බස්නාහිර පළාත්, පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් රු.1,636,445 ක් මණ්ඩලයට ලැබී තිබූ අතර, 2023 අප්‍රේල් මස වන තෙක් එම වීඩියෝ පටය නිර්මාණය කර නොතිබුණි. පළාත් සභා සංවර්ධන ව්‍යාපෘතියකට ලැබූ මෙම මුදල් අදාළ ව්‍යාපෘතිය සඳහා යොදා නොගෙන වසර 04 ක් තිස්සේ ඌන උපයෝජිතව බැංකු ගිණුමේ රඳවා තිබුණි. | අදාළ කටයුතු සිදු කෙරෙමින් පවතින බව. | සංවර්ධන ව්‍යාපෘතිවලට ලැබුණු මුදල් එම වර්ෂයේදීම අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට යෙදවිය යුතුය. |

### 1.5.5 ශීර්ෂය 105 - සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හිටපු පළාත් සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් භාවිතා කර තිබූ ජීප් රථය පළාත් සභාවේ නිල කාලය අවසන් වීමෙන් පසු ගම්පහ දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට භාවිත කිරීමට ලබා දී තිබියදී 2022 වර්ෂයේ එකී රථයට අනතුරක් සිදු වී තිබුණු අතර අලුත්වැඩියා කිරීමේ වියදම් රු.19,153,714 ක බවට ඇස්තමේන්තුවක් ලබාදී තිබුණි. මෙම අනතුරෙන් වූ අලාභය සඳහා අදාළ රක්ෂණ සමාගම විසින් රු.7,390,711 ක මුදලක් ගෙවීමට එකඟ වී තිබුණු අතර ඉතිරි රු.11,763,003 ක මුදල අමාත්‍යාංශය විසින් | මෙම රථය වෙනුවෙන් දරන ලද සියළු වියදම් බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමාගේ හා බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගෙන් ලද නියෝග, උපදෙස් හා අනුමැතීන් මත පමණක් සිදුකළ බව. | පළාත් මූල්‍ය රීති 54.3, 54.5 හා 54.6 පරිදි කටයුතු කළ යුතුය. |

දැරීමට තීරණය වී තිබුණි. පළාත් මූල්‍ය රීති 54.3.2 පරිදි අලාභ හානි සඳහා වගකිව යුතු පාර්ශවය නිශ්චය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් 2022 නොවැම්බර් 30 දින පරීක්ෂණයක් පවත්වා තිබූ අතර පළාත් මූල්‍ය රීති 54.6 ප්‍රකාරව පූර්ණ වාර්තා ඉදිරිපත් කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**1.5.6 ශීර්ෂය 107 - මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කළ එළවළු හා පළතුරුවලින් අගය එකතු කළ නිෂ්පාදන සැකසීමේ ව්‍යාපෘතිය වඩාත් ඵලදායි ව්‍යාපාරයක් ලෙස පවත්වා ගෙන යන බව දක්වමින් කිසිදු සම්බන්ධයක් නොමැති ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ පවතින කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙත පවරා තිබූ නමුදු රාජ්‍ය වියදම් පාලනය කිරීමට දැඩිව උපදෙස් දෙමින් නිකුත් කර තිබූ 2022 අප්‍රේල් 22 දිනැති අංක 3/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ විධිවිධානවලට අනුගත වීමෙන් තොරව රු.30,000,000 ක් අළුත් ව්‍යාපෘති සහ අළුතින් ප්‍රාග්ධන වියදම් දැරීමට සිදුවන ආකාරයෙන් ව්‍යාපෘතියේ කටයුතු පුළුල් කිරීමට ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමට යොමුකර තිබීමත්, ව්‍යාපෘති යටතේ අළුත් ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කර තිබීමත් මත රජය විසින් ගෙන තිබූ ප්‍රතිපත්තිමය තීන්දු අභිබවා ක්‍රියාකිරීමට පළාත් සභාව කටයුතු කර තිබුණි. | රාජ්‍ය වියදම් පාලන චක්‍රලේඛ මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවා ඇති නමුත් ව්‍යාපෘතියේ අවශ්‍යතාවය මත මෙම ව්‍යාපෘතිය අනුමත කළ බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර එසේ නොවන්නේ නම් ඒ සඳහා විශේෂ අනුමැතියක් ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2022 අගෝස්තු 08 දිනැති අංක 04/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව නව බඳවා ගැනීම් අත්හිටුවා තිබියදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් ඉහළ අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව එළවළු හා පළතුරුවලින් අගය එකතුකළ නිෂ්පාදන සැකසීමේ ව්‍යාපෘතිය සඳහා 19 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් බඳවා ගෙන එකී කාර්ය මණ්ඩලයට වැටුප් හා දීමනා ගෙවීම පළාත් භාණ්ඩාගාරයට දැරීමට සිදුවී තිබූ අතර ඒ සඳහා රු.1,861,926 ක් වැය කර තිබුණි. | පළාත් භාණ්ඩාගාරයෙන් අමාත්‍යාංශය වෙත නිදහස් කරන ලද රු.මිලියන 10 ව්‍යාපෘතියෙහි සියලු වියදම් දැරීම සඳහා භාවිත කළ හැකි බව හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) විසින් ලබාදුන් උපදෙස් පරිදි අමාත්‍යාංශය කටයුතු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | එළවළු හා පළතුරුවලින් අගය එකතු කළ නිෂ්පාදන සැකසීමේ ව්‍යාපෘතිය හා මාළු හා ඉස්සන්ගේ අගය එකතු කළ නිෂ්පාදන සැකසීමේ ව්‍යාපෘතිය යන ව්‍යාපෘති 02 පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මාර්ග අමාත්‍යාංශයට පවරා දීමෙන් පසු අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා එක් එක් ව්‍යාපෘති අංක යටතේ මුළු ඇස්තමේන්තු සකස් කිරීමෙන් තොරව පළාත් භාණ්ඩාගාරයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.170,000,000 ක ප්‍රතිපාදන වෙන්කර එම මුළු ප්‍රතිපාදනයම කර්මාන්ත සංවර්ධන අධිකාරියට මුදලින් නිදහස් කර තිබීම හේතුවෙන් අධිකාරිය විසින් එම මුදල් ව්‍යාපෘතියට යෙදවීම වෙනුවට ස්ථාවර තැන්පතුවල යොදමින් ආදායම් ඉපයීමට කටයුතු කර තිබුණි. | අංක CSWP/FIN-AP/02/FI/10 හා 2022 ඔක්තෝබර් 14 දිනැති ලිපිය මගින් ලබාදුන් උපදෙස් පරිදි කටයුතු කර ඇත. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අතරමැදි ආයතනය වෙත වැඩ ආරම්භ කිරීමට පෙර එකවර මුළු ප්‍රතිපාදන නිදහස් කිරීම නොකළ යුතුය. |
| (ඈ) | මාළු හා ඉස්සන්ගේ අගය එකතු කළ නිෂ්පාදන සැකසීමේ ව්‍යාපෘතිය සඳහා කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කර තිබූ ව්‍යාපෘතියට අදාළ සමස්ථ ඇස්තමේන්තුවේ ප්‍රාග්ධන හා පුනරාවර්තන යන දෙවර්ගයේම වියදම් අඩංගුව තිබුණද අංක 109-03-2502-13 දරන ප්‍රාග්ධන වැය විෂයය යටතේ වෙන් වූ ප්‍රතිපාදන සලසා තිබීම නිවැරදි තත්ත්වයක් නොවීම හා අමාත්‍යාංශය හරහා අධිකාරියට ලබාදී තිබූ රු.මිලියන 10 ක ප්‍රේෂණවලින් | පළාත් භාණ්ඩාගාරයෙන් දැනටමත් අමාත්‍යාංශය වෙත නිදහස් කරන ලද රුපියල් මිලියන 10 ව්‍යාපෘතියේ සියලු වියදම් දැරීම සඳහා භාවිත කළ හැකි බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) විසින් ලබාදුන් උපදෙස් පරිදි කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රාග්ධන වැය විෂයයන්ට ලැබෙන ප්‍රතිපාදන පුනරාවර්තන වැය විෂයයන් සඳහා භාවිතා නොකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.8,967,000 ක පුනරාවර්තන වියදම් ඇතුළත්ව තිබීම සැලකිල්ලට නොගෙන ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුව සඳහා ප්‍රාග්ධන වැය විෂයය යටතේ ප්‍රතිපාදන වෙන් කර මුදල් වැය කර තිබීම මත ව්‍යාපෘතිවල ගිණුම් තැබීම ව්‍යාකූල තත්ත්වයකට පත්ව තිබුණි. | | |

**1.5.6.1 බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1996 අගෝස්තු 19 දිනැති අංක 937/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද බස්නාහිර පළාත් සභාවේ 1995 අංක 01 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා නියෝගවලට අදාළ කොන්දේසි යටතේ "අවසර පත්‍රය වලංගු වන්නේ එහි නිශ්චිතව සඳහන් කර ඇති බස් රථය සඳහා සහ එසේම සඳහන් කර ඇති මාර්ගය සඳහා පමණකි" යනුවෙන් සඳහන් වුවද, අවසර පත්‍රය ලබා දුන් මාර්ගය හැර වෙනත් මාර්ගවල ගමන් කිරීම සඳහා අධිකාරිය විසින් විශේෂ වාරිකා බලපත්‍ර ලබාදී තිබුණි. | ප්‍රමාණවත් බස් රථ සංඛ්‍යාවක් දෛනිකව ධාවනය නොවීම වැනි අවස්ථාවලදී නිත්‍ය මගී සේවා අවසරලාභී බස් රථ මගී අවශ්‍යතාව සපුරා ගැනීම සඳහාත්, නිත්‍ය සේවාව පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් තරම් ආදායමක් නොලැබීම නිසාත් තවකාලිකව බස්රථ ධාවනයට යොදවා ගනී. | ප්‍රඥප්තියට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී කිසිදු අනුමැතියක් ලබා ගැනීමකින් තොරව රු.1,717,590 ක් බොල් ණය ලෙස පොත්වලින් කපා හැරීමට අධිකාරිය කටයුතු කර තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | බොල් ණය කපාහැරීම් නැවත ගිණුම්වලින් ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් පවත්වා ගෙන යනු ලබන මධ්‍යම රියදුරු පාසැල 2007 නොවැම්බර් 12 දින සිට මෝටර් රථ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ආධුනිකත්ව රියදුරු පුහුණුව ලබාදීම සඳහා වන A ශ්‍රේණියේ රියදුරු පාසලක් ලෙස බලපත්‍රය ලබා ගෙන පවත්වා ගෙන ගොස් තිබූ අතර, 2021 නොවැම්බර් 11 දිනෙන් බලපත්‍රය අවලංගු වී තිබුණි. එසේ වුවද, A ශ්‍රේණියේ රියදුරු පාසැලක් ලෙස පවත්වා ගෙනයාම සඳහා රියදුරු | විගණනයෙහි දක්වා ඇති කාලසීමාව තුළ පුහුණු පාසල් බලපත්‍රය වලංගු කිරීමට නොහැකි වූයේ මෙම අධිකාරියේ පාලනයෙන් බැහැර කරුණක් නිසා බව කාරුණිකව දන්වමි. | මධ්‍යම රියදුරු පාසල විධිමත්ව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | උපදේශකවරු තිදෙනෙකු සිටිය යුතු වුවත්, 2022 ඔක්තෝබර් මස වන විට මධ්‍යම රියදුරු පාසැල සතුව එක් උපදේශකවරයෙකු පමණක් සිටීම හේතුවෙන් A ශ්‍රේණියේ හෝ B ශ්‍රේණියේ පාසල් බලපත්‍රයක් ලබා ගැනීමට නොහැකි වී තිබූ අතර, C ශ්‍රේණිය යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට සිදුව තිබුණි. ඒ අනුව මධ්‍යම රියදුරු පාසැලේ ප්‍රමිතිය C දක්වා පහල ගොස් තිබූ අතර, බරවාහන පුහුණු කිරීමේ පාඨමාලාව නවතා දැමීමට සිදු වී තිබුණි. | | |
| (ඈ) | අධිකාරියට අයත් කඩකාමර 224 අතුරින් කඩකාමර 42 ක් වසර 01 – 08 කාලයක සිට බදු හෝ කුලී ගිවිසුමකට යටත්ව ව්‍යාපාර කටයුත්තක් සඳහා වෙනත් පාර්ශවයන් වෙත ලබාදී නොතිබුණි. | මෙතෙක් බදු ගැනුම්කරුවකු සොයා ගැනීමට නොහැකි වී ඇත. ඉදිරියේ දී බදුදීමට කටයුතු කරමි. | බදු හෝ කුලී ගිවිසුමක් මත කඩ කාමර ලබාදී ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | අධිකාරියට අයත් කඩ කාමර 224 න් කඩ කාමර 68 ක් වසර 04 කට වඩා වැඩි කාලයක සිට බදු ගිවිසුමකින් තොරව හා කිසිදු මුදලක් අයකිරීමකින් තොරව බාහිර පාර්ශවයන්ට ලබාදී තිබූ අතර, අධිකාරියට ලැබිය යුතු කඩ කුලී ආදායම් අය කර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | මෙම ගැටළු නිරාකරණය කර ගැනීමට විශාල වශයෙන් කටයුතු කරමින් පවතී. | බදු ගිවිසුම්වලට එළඹීමට හා අයවිය යුතු කඩකුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට සහ ජනතා සන්තක ප්‍රවාහන සේවාවන්ට අයත්ව තිබූ බස් නැවතුම්පළවල් 18 ක් 1996 පෙබරවාරි 29 දින පළාත් සභාව වෙත පැවරී තිබුණි. ඒ අනුව පැවරුම් සහතික මගින් මෙහි භෞතික භාවිත අයිතිය පමණක් අධිකාරිය වෙත හිමි වී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 26ක් ගත වී තිබුණද එහි නෛතික අයිතිය පවරා ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි. | ගැටලු අවම වන ආකාරයට අදාල නැවැතුම්පළ පවරා ගැනීමේ කටයුතු සිදුකරමි. | බස් නැවතුම්පළවල නෛතික අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | තොරතුරු තාක්ෂණය මත පදනම් වූ පරිගණක ක්‍රමවේදයක් සැලසුම් කිරීම හා ස්ථාපනය කිරීම සඳහා 2006 ඔක්තෝබර් මස සිට වසරක කාල සීමාවක් සඳහා කොළඹ විශ්ව | ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නිර්දේශ සහිත වාර්තාවක් ලබාගැනීම සඳහා කමිටුවක් පත්කර ඇත. ඒ | තොරතුරු තාක්ෂණික පද්ධතිය ස්ථාපිත කිරීමට කඩිනමින් පියවරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විද්‍යාලය සමග එකඟතා ගිවිසුමකට එළඹ තිබූ අතර ඒ සඳහා අවස්ථා දෙකකදී රු.850,000 ක මුදලක් කොළඹ විශ්ව විද්‍යාලයට ගෙවා තිබුණි. ඊට අමතරව පරිගණක උපකරණ හා මෘදුකාංග වෙනුවෙන් රු.1,404,916 ක් ලෙස එකතු වටිනාකම රු.2,254,916 ක වියදමක් දරා පද්ධතිය ස්ථාපනය කර තිබුණි. 2010 වර්ෂයේ පද්ධතියේ ඇති වූ දෝෂ සහගත තත්වයන් හේතුවෙන් ස්ථාපිත කරන ලද දිනයේ සිට වසර 13 ක කාලයක් ගත වී තිබුණද කිසිදු ප්‍රයෝජනයක් ගැනීමට නොහැකි වී තිබුණි. | අනුව ඉදිරි කටයුතු කිරීමට නියමිතය. | |
| (ඌ) | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් ආදායම් උත්පාදන ඒකකයක් ලෙස පවත්වා ගෙන යනු ලබන මධ්‍යම රියදුරු පාසලේ පුහුණුව ලබා ගන්නා රියදුරන්ගේ සංඛ්‍යාව ඉතාම අඩු මට්ටමක පැවති අතර ඒ හේතුව මත පසුගිය වර්ෂ 05 ක කාලය තුළ දිගින් දිගටම අලාභ පැවතුණි. සමාලෝචිත වර්ෂයේදී රියදුරු පාසැලේ ආදායම රු.1,864,350 ක් වූ අතර, වැටුප් හා වේතන, දීමනා, ඉන්ධන, වාහන නඩත්තු වියදම් ඇතුළු රියදුරු පුහුණු පාසැලේ සියළු වියදම් එකතුව රු.5,148,575 ක් වූයෙන් මෙහෙයුම් අලාභය රු.3,284,224 ක් විය. | පෞද්ගලික පුහුණු ආධුනිකයන්ගේ ගණන සීමිත වීම නිසා උපයන ආදායම අඩු වී ඇති නමුත් සේවක පරිපාලන වියදම් යනාදි අනිවාර්ය වියදම් නිසා මෙම අලාභදායී මෙහෙයුම් කාර්ය සාධනය දක්නට ඇත. | මධ්‍යම රියදුරු පාසලේ ආදායම් උත්පාදනය කිරීමට අවශ්‍ය පියවරගත යුතුය. |
| (එ) | මධ්‍යම රියදුරු පාසැල විසින් පවත්වා ගෙන යනු ලබන මෝටර් බයිසිකල් පුහුණු පාඨමාලාව සඳහා 2018 වර්ෂයේ සිට 2022 දක්වා වර්ෂ 05 ක ලියාපදිංචි සිසුන් හා බලපත්‍ර ලබා ගත් සිසුන් පිළිබඳ දත්ත පරීක්ෂාවේදී 2020 වර්ෂයේදී සිසුන් 04 දෙනෙකු මෝටර් සයිකල් පුහුණුව ලබා බලපත්‍ර ලබාගෙන තිබුණද, 2018, 2019, 2021 හා 2022 යන වර්ෂවලදී කිසිදු ශිෂ්‍යයකු මෝටර් බයිසිකල් පුහුණුව සඳහා ලියාපදිංචි කර නොතිබුණි. | යතුරුපැදි පුහුණුව සඳහා 2015 නොවැම්බර් 02 අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව රියදුරු පාසලකට ක්ලච් එක සහිත එන්ජින් ධාරිතාව අශ්වබල 100 කට වැඩි සහ අඩු යතුරු පැදි දෙකක් තිබිය යුතු බව සඳහන් කර ඇත. මීට පෙර රියදුරු පාසල සතුව තිබුණේ UA 8202 දරන ක්ලච් එක සහිත එන්ජින් ධාරිතාව 100 ට වැඩි යතුරු පැදිය පමණි. | පුහුණු පාඨමාලාව පවත්වාගෙන යාමට අවශ්‍ය පියවරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | 2013 ඔක්තෝබර් 30 දිනැති අංක 1834/27 දරන ගැසට් නිවේදනය අනුව කුලී පදනම මත යොදවා ඇති ත්‍රීරෝද රථ අධිකාරියෙන් ලියාපදිංචි කිරීම ආරම්භ කර ඇතත්, එය 2002 අංක 06 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන ත්‍රීරෝද රථ ප්‍රඥප්තියට පටහැනිවීම හේතුවෙන් ඇති වූ නීතිමය ගැටලු මත ත්‍රීරෝද රථ සංගම් ලියාපදිංචි වීමෙන් වැළකී සිටීම නිසා 2020 වර්ෂයේදී ත්‍රී රෝද රථ ලියාපදිංචි කටයුතු නතර කර දමා තිබුණි. නීතිමය වලංගුභාවය තහවුරු කර ගැනීමෙන් තොරව අධිකාරිය ත්‍රීරෝද රථ ලියාපදිංචිය ආරම්භ කර තිබුණි. 2022 වර්ෂයට නව රීති පනවා ත්‍රී රෝද රථ ලියාපදිංචිය හා නියාමන කටයුතු ආරම්භ කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයටත් එම රීති ක්‍රියාත්මක වී නොතිබුණි. | ත්‍රී රෝද රථ ලියාපදිංචිය හා නියාමනය සම්බන්ධව පැවති නෛතික ගැටළු සංශෝධන මගින් නිරාකරණය කර ගනිමින් නව රීති සකස් කිරීම ආදී කටයුතු මෙම වර්ෂයේ ආරම්භ කර ඇත. | නෛතික ගැටළු නිරාකරණය කර ත්‍රීරෝද රථ කාර්යාංශය පවත්වාගෙන යාමට අවශ්‍ය පියවරගත යුතුය. |
| (ඔ) | 1992 අංක 01 දරන බස්නාහිර පළාතේ පළාත් සභාවේ මාර්ගස්ථ මගී සේවා ප්‍රඥප්තිය යටතේ 2007 මාර්තු 16 දිනැති අංක 1488/32 දරන ගැසට් පත්‍රයේ සඳහන් 3.1 නියෝගය ප්‍රකාරව, පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ධාවකයා තෝරා ගැනීමේදී බස්නාහිර පළාත තුළ පවත්නා මගී ප්‍රවාහනය සඳහා බස් රථ ධාවනය කළ හැකි මාර්ගවල පවතින හෝ ඇතිවන පුරප්පාඩු හෝ අවශ්‍යතා සඳහා බස් රථ යෙදවීම පිණිස මඟී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම කරනු ලබන්නේ ටෙන්ඩර් ක්‍රමය මගින් තෝරා ගනු ලබන බස් හිමි ධාවකයින් වෙත පමණක් ලෙස දක්වා තිබුණද, ඊට පටහැනිව අධිකාරිය විසින් 2022 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය සේවා, සුඛෝපභෝගී සේවා, අධිවේගී සේවා යටතේ මගී සේවා බලපත්‍ර 6161 ක් නිකුත් කර තිබුණු අතර, ඉන් බලපත්‍ර 5064 ක් හෙවත් නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාවෙන් සියයට 82 ක් විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කිරීමෙන් තොරව ලබාදී තිබුණි. | අවසරපත්‍ර නියමයන් හා කොන්දේසි කඩ කිරීමේ විශේෂ අවස්ථාවකදි හැර අධිකාරියේ ප්‍රායෝගිත භාවිතය තුළ අවසරපත්‍ර අවලංගු කිරීමකින් තොරව එම බලපත්‍ර වාර්ෂිකව දීර්ඝ කරමින් වර්තමානය දක්වා පවත්වා ගෙන ගොස් ඇත. | ප්‍රඥප්තියට හා ටෙන්ඩර් පටිපාටියට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඕ) | 1992 අංක 01 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ 13(2) ඡේදය ප්‍රකාරව සෑම මගී සේවා අවසර පත්‍රයක්ම එය කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස නිකුත් කරන ලද දිනයේ සිට මාස දොළහක සිට මාස තිස් හයක කාලසීමාවක් වලංගුවිය යුතුය. එසේ වුවද, අධිකාරිය විසින් 2022 දෙසැම්බර් 31 දිනට සමාන්‍ය සේවා, සුඛෝපභෝගී සේවා හා අධිවේගී සේවා යටතේ නිකුත් කර තිබූ මගී සේවා බලපත්‍ර 6161 න්, 2021 හා 2022 වර්ෂවල ටෙන්ඩර් මගින් නිකුත් කර තිබූ මගී සේවා ටෙන්ඩර් බලපත්‍ර 110 ක් පමණක් එලෙස වසර 03 ක කාලසීමාවකට යටත්ව ලබාදී තිබූ අතර, මගී සේවා අවසර පත්‍ර 6051 ක් ජීවිතකාලයටම එකවර (Life time) පදනම මත ලබා දී තිබුණි. | මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීමේදී ජීවිත කාලයටම එකවර ලබාදීමේ පදනම වෙනස් කරමින් වසර 03 ක කාලසීමටවකට යටත්ව අවසරපත්‍ර නිකුත් කිරීම සඳහා 2022 ජූලි මස සිට කටයුතු කල අතර ඒ අනුව එම ටෙන්ඩර් කොන්දේසි යටතේම 2023 පෙබරවාරි මස මගී සේවා අවසරපත්‍ර ටෙන්ඩර් කිරීම සිදු විය. | ප්‍රඥප්තියට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ක) | මාර්ග 133 කට අදාළව අවසරපත්‍ර පුරප්පාඩු 415 ක් පිරවීම සඳහා 2022 ජූලි මස ටෙන්ඩර් කැඳවා තිබුණි. එසේ වුවද, එම පුරප්පාඩු 415 අතුරින් 56 ක් පමණක් පුරවා තිබූ අතර, 359 ක් හෙවත් සියයට 87 ක් සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණි. පුරප්පාඩු 359 ක් සම්පූර්ණ කිරීමට නොහැකිවීම මත ග්‍රාමීය මාර්ගවල මගී සේවා කටයුතු අඩපණවීමේ තත්ත්වයක් උදා වී තිබුණි. | ආයෝජකයන් මගී ප්‍රවාහන ක්ෂේත්‍රයේ ආයෝජනය කිරීමට උනන්දු නොවීම මත සාමාන්‍ය වශයෙන් මුළු පුරප්පාඩු සංඛ්‍යාවෙන් සියයට 80 ක ප්‍රමාණයක්ම අවසරපත්‍ර නිකුත් කිරීමේ හැකියාව නොපවතී. | පුරප්පාඩු අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ග) | 2021 වර්ෂයේ බස් මාර්ග කිහිපයකට මගී සේවා අවසර පත්‍ර ලබාදීමට ලංසු කැඳවා තෝරා ගත් බස් රථ ධාවකයින් මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමෙන් පසු අදාළ ටෙන්ඩර් කොන්දේසි අංක 5.1 ප්‍රකාරව මගී සේවා අවසර පත්‍රය පිරිනැමීමේ ලිපිය යැවූ දින සිට දින 60 ක් ඇතුළත බස් රථ ප්‍රවාහන සේවයට එක් කර ප්‍රවාහන සේවාව ආරම්භ කළ යුතු වුවද, එකතුව රු.14,020,450 ක් වූ මුළු මුදලම ගෙවූ බස් ධාවකයින් 18 දෙනෙකු සඳහා මගී සේවා අවසර පත්‍රය පිරිනමා වසර 01 මාස 08 ක් ගත වී තිබුණද, අදාල බස් රථ ධාවනයට එක් කර නොතිබුණි. මේ | බස්නාහිර පළාතේ මගී අවශ්‍යතා සපුරාලීම සඳහා රටේ පැවති කොරෝනා වසංගතය, ආර්ථික අර්බුදය හා පොදු ප්‍රවාහනයේ ආදායම් අවස්ථා පහළ මට්ටමක පැවැත්ම නිසා ආයෝජන ප්‍රතිලාභ අඩු වීම යන කරුණු පාදක කර ගෙන මගී සේවා බලපත්‍ර ලබා ගැනීම අඩු මට්ටමකට පැමිණ ඇත. | බස්රථ ධාවනයට යොමු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අනුව මගී සේවා අවසර පත්‍ර පිරිනැමීමේ මූලික පරමාර්ථය ඉටු කර ගැනීමට අධිකාරියට නොහැකි වී තිබුණි. | | |
| **(ච)** | ටෙන්ඩර් කොන්දේසි මාලාවේ 21.6 ප්‍රකාරව, යම් ලංසුකරුවකු විසින් මාර්ගයකට හෝ මාර්ග කීපයකට තෝරා ගනු ලැබූ ඉහළම ලංසුව ඉදිරිපත් කරන ලද අවස්ථාවක අදාළ මාර්ගය සඳහා බස් රථයක් යෙදවීමට අපොහොසත් වුවහොත් ඔහු විසින් ගෙවන ලද ලංසු ඇපකරය අධිකාරියට පවරා ගන්නා බව සඳහන්ව තිබුණද, එපරිදි කටයුතු නොකර 2021 හා 2022 වර්ෂයන්හි ටෙන්ඩරයන්හි ඉහළම ලංසුව ඉදිරිපත් කර මගී සේවා අවසර පත් ලබාදී තිබුණද, බස් රථ යොදවා ප්‍රවාහන සේවාව ආරම්භ කර නොමැති, 2021 වර්ෂයේ ලංසු ඉදිරිපත් කර තිබූ බස් ධාවකයින් 13 දෙනෙකුගේ රු.940,000 ක ලංසු ඇපකරද, 2022 වර්ෂයේ බස් ධාවකයින් 03 දෙනෙකුගේ රු.300,000 ක ලංසු ඇපකරද නිදහස් කිරීමට අධිකාරිය කටයුතු කර තිබුණි. | ටෙන්ඩර් උපදෙස් හා කොන්දේසි මාලාවේ 4.1 වගන්තිය අනුව සියලු මුදල් ගෙවා අවසන් කර ඇති බැවින් මෙම ඇප තැන්පතු නිදහස් කිරීමට කටයුතු කර ඇති අතර බස්රථ යෙදවීම ප්‍රමාද වන්නේ නම්, කොන්දේසි මාලාවේ 5.3 වගන්තිය අනුව කටයුතු කිරීමට සිදුවන බැවින්, එම ඇප මුදල් නිදහස් කිරීමේ දී බස්රථ යෙදවීම පිළිබඳව සලකා බලා නොතිබුණි. | ටෙන්ඩර් කොන්දේසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| **(ඡ)** | 2022 දෙසැම්බර් 31 දිනට මගී සේවා අවසර පත්‍ර ලබාදීම වෙනුවෙන් ලැබිය යුතු ලංසු ඇපකර තැන්පතු ආදායම වූ රු.42,766,741 ක් සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | ටෙන්ඩර් කොන්දේසි සම්පූර්ණ නොකිරීම හේතුවෙන් නිකුත් කළ ඇතැම් බලපත්‍ර අවලංගු කර ඇත. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකරගත යුතුය. |
| **(ට)** | අධිකාරියේ මධ්‍යම පුහුණු පාසැලේ බරවාහන පුහුණු පාඨමාලාවන් පුහුණු කිරීමේ බස් රථය 2007 වර්ෂයේදී රු.3,171,350 ක පිරිවැයක් දරමින් මිලදී ගෙන තිබුණද මෙම බස් රථය දැනට වසර 03 කට ආසන්න කාලයක් පුහුණු කිරීමේ කටයුතු සිදු කිරීමෙන් තොරව හෝමාගම බස් නැවතුම් අංගනයේ අනාරක්ෂිතව ගාල්කර තිබුණි. | මධ්‍යම පුහුණු පාසලේ කටයුතු සඳහා යොදාගත් බස්රථය සහන ගාස්තු යටතේ කුලියට දීම සඳහා 2022 මාර්තු මස අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගත්තද ඉන්ධන අර්බුදය හා ආර්ථික අවපාතකාරී තත්වයන් හේතුවෙන් මේ දක්වා ක්‍රියාත්මක කිරීමට නොහැකිව පවතී. | බස් රථය ඵලදායී කාර්යයකට උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඩ) | බස්නාහිර පළාත තුළ ධාවනය වන පෞද්ගලික බස් රථවල ධාවන කටයුතු විධිමත් කිරීමේ අරමුණින් මාර්ග 16 ක බස්රථ ධාවනයේ යෙදවීමේදී ගතවන වේලාව, වේලා සටහන් යන්ත්‍ර මගින් සටහන් කිරීමත් එමගින් බස් රථවල ධාවනය වන කාලය කළමනාකරණය කිරීම සඳහා වේලා සටහන් යන්ත්‍ර 40 ක් හා ඊට අදාළ මෘදුකාංගය 2018 නොවැම්බර් 23 දින රු.3,013,000 කට මිලදී ගෙන තිබුණි. මෙම වේලා සටහන් යන්ත්‍ර 40 ප්‍රාදේශීය කාර්යාල 07 සඳහා බෙදා හැර තිබුණද, 2023 මාර්තු 31 වනවිටත් එයින් වේලා සටහන් යන්ත්‍ර 04 ක් පමණක් භාවිතා කරන අතර, යන්ත්‍ර 36 ක් භාවිතා කිරීමෙන් තොරව ප්‍රාදේශීය කාර්යාලවල නිෂ්ක්‍රීයව පැවතුණි. | මාර්ග 16ක වේලා සටහන් යන්ත්‍ර 40ක් යොදා ගෙන බස් රථ ධාවනය 2019 අගෝස්තු සිට 2020 මාර්තු 26 වන තෙක් සිදු කෙරුණි. නමුත් 2020 මාර්තු අවසන් සතියේ කොවිඩ් උවදුර නිසා නිරෝධායන ඇඳිරි නීතිය සහ සංචාරක සීමා හේතු කර ගෙන බස් රථ ධාවනය නොවීම හා ඉතා අවම මට්ටමක පැවතිම හේතුවෙන් සත්කාරකය වසා දැමීමට සිදු විය. | වේලා සටහන් යන්ත්‍ර හා මෘදුකාංග භාවිතයට ගැනීමට අවශ්‍ය පියවරගත යුතුය. |
| (ණ) | 2014 වර්ෂයේදී රු.2,280,000 ක පිරිවැයක් දරා ගුණසිංහපුර බස් නැවතුම්පලෙහි සවිකරන ලද සූර්ය බලශක්ති පද්ධතිය 2021 පෙබරවාරි මාසයේ සිට අක්‍රියව පවතින අතර, මෙම සූර්ය බලශක්ති පද්ධතිය නැවත යථා තත්ත්වයට පත් කිරීමට 2023 අප්‍රේල් වනවිටත් නොහැකි වී තිබුණි. තවද 2021 හා 2022 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලද මෙම පද්ධතිය භෞතිකව පවතින බවට සනාථ කර නොතිබුණි. | මෙම සූර්ය බලශක්ති පද්ධතිය නැවත යථා තත්ත්වයට පත්කර ගැනීම සඳහා සූර්ය බලශක්ති නියාමන කොමිසමට ලිපියක් යොමු කර ඇතත්, මේ දක්වා අදාල ආයතනයෙන් පිළිතුරක් ලැබී නොමැත. | සූර්ය බලශක්ති පද්ධතිය යථා තත්ත්වයට පත්කළ යුතුය. |
| (ත) | පිරිවැය රු.595,000 කට 2002 වර්ෂයේදී මිලදී ගත් විදුලි ජනන යන්ත්‍රය භාවිතයට ගැනීමෙන් තොරව වසර 05 කට අධික කාලයක් ප්‍රධාන කාර්යාලයේ පැවති අතර, අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අවශ්‍යතාවය පවතින ප්‍රාදේශීය කාර්යාලයක් වෙත යොමු කිරීමට කටයුතු කර නොතිබුණි. | 2002 අප්‍රේල් 30 දින රු.595,000 වටිනාකමකට මිලට ගත් විදුලි ජනන යන්ත්‍රය වසර කිහිපයක සිට ක්‍රියා විරහිත තත්වයේ පවතී. | විදුලි ජනන යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට අවශ්‍ය පියවරගත යුතුය. |
| (ද) | බස්නාහිර පළාත තුළ ලියාපදිංචි කර ඇති ත්‍රීරෝද රථ අධිකාරිය යටතේ පාලනය වන ත්‍රීරෝද රථ කාර්යාංශයේ ලියාපදිංචි කිරීමේ වැඩසටහන සඳහා 2018 වර්ෂයේදී රු.2,750,000 ක් වටිනා හැඳුනුම්පත් බහාලුම් 50,000 ක් මිලදී ගෙන තිබූ අතර, කිසිදු භාවිතයකින් තොරව | ත්‍රීරෝද රථ ලියාපදිංචිය හා නියාමන කටයුතු සිදු කිරීමට අපොහොසත් වීම නිසා එම බහාලුම් අධිකාරියේ ගබඩා තුළ නිෂ්කාර්යව පවතී. | අවශ්‍යතාවය සලකාබලා මිලදී ගැනීම් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වසර 05 කට ආසන්න කාලයක් අධිකාරියේ ගබඩා තුළ නිශ්කාර්යව පැවතුණි. | | |
| (න) | 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව කොළඹ 04 ප්‍රාදේශීය කාර්යාලයට අයත් බල ප්‍රදේශය තුළ ස්ථාපිත කර ඇති රු.2,778,225 වටිනා වේලා සටහන් මැදිරි 17 ක ඌනතාවයක් පැවතුණි. | වේලා සටහන් මැදිරිවලද භෞතික සංගණනයක් සිදුකර සිදුවී ඇති දෝෂයන් ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බවට සදහන් කරමි. | ඌනතා සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ප) | අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල 05 කට අයත් බල ප්‍රදේශ තුළ ස්ථාපිත කර ඇති රු.1,988,656 ක් පිරිවැය වූ මගී ආවරණ 15 ක් වසරක 01 කට වඩා වැඩි කාලයක සිට අස්ථාගත වී තිබුණි. මගී ආවරණ අස්ථාගතවීම පිළිබඳව පළාත් මූල්‍ය රීති 52 සිට 62 දක්වා නියම කර ඇති පරිදි කටයුතු කිරීමට සමාලෝචිත වර්ෂය අවසානයටත් කටයුතු කර නොතිබුණි. | මගී ආවරණ සම්බන්ධයෙන් අදාල ප්‍රාදේශීය කාර්යාලවල කළමණාකරුවන්ගෙන් තොරතුරු ලබාගෙන, ඒ අනුව හානිපාඩු පරීක්ෂණයක් පවත්වා වගකිවයුතු නිළධාරීන්ගෙන් සිදුවී ඇති අලාභය පියවා ගැනීමට ඉදිරියේ දී කටයුතු සිදුකරනු ලබන බව සදහන් කරමි. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (බ) | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුර 2016 අප්‍රේල් 25 දින සිට පුරප්පාඩුව පැවති අතර 2017 පෙබරවාරි 22 දින සිට මෙම තනතුරේ වැඩ බැලීම සඳහා කොළඹ 03, ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකරු, පත් කර තිබුණි. මෙම නිලධාරියා ආයතන සංග්‍රහයේ 12.5.4 ප්‍රකාරව තම නිත්‍ය තනතුරේ සම්පූර්ණ පාරිශ්‍රමිකය හා වැඩ බලන තනතුරේ මූලික වැටුපෙන් සියයට 25 ක් වැඩ බලන දීමනා ලෙස ලබා ගෙන තිබුණි. ඒ අනුව වැඩ බැලීමේ දීමනා ලෙස 2017 පෙබරවාරි 22 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා වසර 05 මාස 10 ක් සඳහා රු.1,429,225 ක් දීමනා ලෙස ලබා ගෙන තිබුණද, එම නිලධාරියගේ නිත්‍ය තනතුර වන ප්‍රාදේශීය කළමණාකරු තනතුරේ රාජකාරී කටයුතු කර නොතිබූ බවත් පූර්ණ කාලීනව අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුරේ පමණක් සේවය කර තිබූ බව තහවුරු | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | අවිධිමත් හා නීත්‍යානුකූල නොවන ලෙස කරන ලද ගෙවීම් නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විය. එසේම ඔහුගේ නිත්‍ය තනතුර සඳහා වෙනත් නිලධාරියකු රාජකාරී ආවරණය කිරීම සඳහා පත් කර තිබූ බවත් මෙම නිලධාරියාට වැඩ බැලීමේ වැටුප ලෙස ගෙවා තිබුණු රු.1,429,225 ක මුදල අවිධිමත් හා නීත්‍යානුකූල නොවන ගෙවීමක් විය. | | |
| (ම) | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුර 2016 ජූලි 01 දින සිට පුරප්පාඩුව පැවති අතර, 2017 පෙබරවාරි 22 දින සිට කොළඹ 04 බැස්ටියන් මාවත ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකරු, තනතුරේ වැඩ බැලීම සඳහා පත් කර තිබුණි. මෙම නිලධාරියා ආයතන සංග්‍රහයේ 12.5.4 ප්‍රකාරව තම නිත්‍ය තනතුරේ සම්පූර්ණ පාරිශ්‍රමිකය හා වැඩ බලන තනතුරේ මූලික වැටුපෙන් සියයට 25 ක් වැඩ බැලීමේ දීමනා ලෙස ලබා ගෙන තිබුණි. වැඩ බැලීමේ දීමනා ලෙස 2017 පෙබරවාරි 22 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා වසර 05 මාස 10 ක් සඳහා රු.1,429,225 ක් දීමනා ලෙස ලබා ගෙන තිබුණද, එම නිලධාරියගේ නිත්‍ය තනතුරේ රාජකාරී කටයුතු කර නොතිබූ බවත් පූර්ණ කාලීනව අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුරේ පමණක් සේවය කර තිබූ අතර මෙම නිලධාරියාට වැඩ බැලීමේ වැටුප ලෙස ගෙවා තිබුණු රු.1,429,225 ක වටිනාකම, අවිධිමත් හා නිත්‍යානුකූල නොවන ගෙවීමක් විය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | අවිධිමත් හා නීත්‍යානුකූල නොවන ලෙස කරන ලද ගෙවීම් නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ය) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අධිකාරියේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතුය. එසේ වුවද, 2020 නොවැම්බර් 16 සිට අධිකාරියේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 02 කට අධික කාලයක් ගත වී තිබුණද, ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | විගණන පනතට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ර) | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපතිවරයාගේ නිල රාජකාරී කටයුතු සඳහා වෙන් කර තිබූ වර්තමාන තක්සේරු වටිනාකම රු.18,500,000 ක්වූ කැබ් රථයක් 2021 මැයි 09 වන දින රටෙහි පැවති නොසන්සුන් වාතාවරණය යටතේ අරගලකරුවන් විසින් මොරටුව ප්‍රදේශයේදී ගිනි තබා තිබූ අතර එම ගින්නෙන් කැබ් රථය මුළුමනින්ම විනාශ වී තිබුණි. සභාපතිවරයා විසින් විගණනයේදී ලබා දී තිබූ ප්‍රකාශය අනුව කැබ් රථයට පහර දී ගිනි තබන අවස්ථාවේදී නිල වාහනය සඳහා අනුයුක්ත රියදුරු නොවන බාහිර පුද්ගලයෙකු විසින් කැබ් රථය පදවාගෙන ගොස් තිබූ අතර නිල රාජකාරී ගමනක් නොව දේශපාලන සාකච්ඡාවක්/ රැස්වීමක් සඳහා සහභාගී වී ආපසු පැමිණීමේ දී රථය අනතුරට පත්වී තිබූ බව අනාවරණය විය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.6.2 මාර්ග සංවර්ධන අධිකාරිය(බ.ප.)**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් මූල්‍ය රීති 51, 52.1, 54, 55, 76.1.8 සහ 106 අනුව කල්පසු වූ ලැබිය යුතු ශේෂ අයකර ගැනීම සඳහාත්, මුදල් අයකර ගැනීමෙන් තොරව කුලියට යන්ත්‍ර දීමට අදාලව වගකිවයුතු නිළධාරීන් හඳුනා ගැනීම සඳහාත්, එසේම තවදුරටත් ණය පදනම මත සේවය සැපයීමේදී අනුගමනය කළ යුතු කාර්යපටිපාටීන් නිශ්චිතව ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වුවද 1996 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාලයක සිට අස්ගිරිය, මොරගහහේන හා රත්මලාන ප්‍රාදේශීය කාර්යාල මඟින් යන්ත්‍ර කුළියට දීම හා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් අධිකාරියට ලැබිය යුතු රු.14,865,587 ක ශේෂය අය කර ගැනීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන | මූල්‍ය රීති ප්‍රකාරව ගිණුම් වලින් කපා හැරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්දේශ කර ඇති අතර අනුමැතිය ලබා ගැනීම සඳහා ප්‍රධාන ලේකම් වෙත යොමු කර ඇත. | පළාත් මූල්‍ය රීති අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විටත් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (ආ) | අම්පාර දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවලින් අධිකාරියට ලැබිය යුතු රු.143,122,503 කින් රු.24,518,490 ක සහතික කර තිබූ බිල්පත් වටිනාකමක් අඩුකර ලැබිය යුතු ශේෂයට ගලපා තිබූ අතර අඩුකළ එම වටිනාකම, ව්‍යාපෘති පොදු වියදම් ගිණුමට පසුව ගලපා තිබුණි. කෙසේ වුවද රු.මිලියන 24.52 ක ගිණුම්ගත කර තිබූ බිල් වටිනාකමක් අඩුකිරීමට නිශ්චිත හේතු සඳහන් කර ඒ සඳහා පළාත් මූල්‍ය රීති 62.3.2 ප්‍රකාරව පළාත් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද පළාත් සභාවට ලැබිය යුතු වෙනත් ගාස්තු අත්හැර දැමීමකදී, හෝ අයකරගත නොහැකි පළාත් ආදායම් අතහැර දැමීමකදී නොසැලකිල්ලක් හෝ වරදක් හෝ වංචාවක් හෝ සිදුවී නොමැති බව විධිමත් පරීක්ෂණයක් මඟින් තහවුරු කරගත යුතු වුවත් එසේ කර නොතිබුණි. | මූල්‍ය රීති ප්‍රකාරව ඉදිරි කටයුතු කිරීමට කමිටුවක් පත්කර ඇත. | පළාත් මූල්‍ය රීති අනුගමනය කළ යුතුය. |
| (ඇ) | මොරටුව විධායක ඉංජිනේරු කාර්යාලය මඟින් විජේරාම මාර්ගය හා තලපත්පිටිය කනත්ත මාර්ගය ඉදිකිරීමේදී එකී මාර්ගයන් දෙකෙහි ඇස්පෝල්ට් ඇතිරීම පිළිබඳව ස්ථානීය පරීක්ෂණයන්ට අනුව අතුරා ඇති ඇස්පෝල්ට් ප්‍රමාණයට වඩා බිල්පත් අනුව ගෙවීම් කිරීමට අනුමත කර තිබූ ඇස්පෝල්ට් ප්‍රමාණය ටොන් 283.56 ක්ද, අතුරා ඇති ඇස්පෝල්ට් ඝණකම 35 mm ට වඩා අඩුවෙන් ඇති අවස්ථාවලදී ගෙවීම් කිරීමට නොහැකි වුවත් එම ප්‍රමාණයට වඩා අඩුවෙන් තිබූ මාර්ග කොටස් 08 ක් වෙනුවෙන් ගෙවීම් කිරීමට අනුමත කර තිබූ ඇස්පෝල්ට් ප්‍රමාණය ටොන් 37.13 ක්ද වශයෙන් ඇස්පෝල්ට් ටොන් 320.6 ක් සඳහා වැඩිපුර අනුමත කර තිබූ අතර ඒ වෙනුවෙන් රු.1,847,678 ක් වැඩිපුර ගෙවා තිබුණි. බිල්පත් වටිනාකමෙන් සියයට 95 ක් අතුරු බිල්පත්වලින් ගෙවා ඇති බැවින් අවසන් බිල්පත | එවැනි කටයුතු තව දුරටත් සිදුනොවීමට මෙම වර්ෂයේ සිට අවසන් බිල්පත් සියයට 75 දක්වා පමණක් ගෙවීම් කිරීමටත්, අභ්‍යන්තර විගණකගේ හා පර්යේෂණ වාර්තා පදනම් කර, සියයට 95 ගෙවීම් කිරීමටත් තීරණය කරන ලදී. | ගිවිසුම් හා කළවැඩ ප්‍රමාණ අනුව ගෙවීම් කළ යුතු අතර වැඩිපුර ගෙවීම් ආපසු අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මඟින් මෙම වැඩිපුර ගෙවා ඇති වටිනාකම අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | | |
| (ඇ) | අධිකාරිය විසින් 2022 වර්ෂය තුළදී මාර්ග සංඥා පුවරු ඉදිකිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමේ දී එක් ආයතනයකින් පමණක් මිල ගණන් කැඳවා මිලදී ගෙන තිබුණි. සංඥා පුවරු සවි කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍යයන් අතරින් GI Sheet සහ GI Pipe සඳහා මිල ගණන් සැසඳීමේ දී අධිකාරිය ඉහළ මිල ගණන් ගෙවා තිබීමෙන් එම අයිතමයන් දෙක සඳහා පමණක් රු. 9,395,730 ක වැඩිපුර මුදලක් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. | රාජ්‍ය ආයතනයක් වන STC ආයතනයෙන් එම කාල සීමාව තුල පැවති මිල ගණන් අනුව එම අමු ද්‍රව්‍යයන් මිලදී ගන්නා ලද අතර වැඩිපුර මුදල් ගෙවීමක් සිදු කර නොමැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | මාර්ග සංවර්ධන අධිකාරියෙන් හා රජයට සම්බන්ධ ආයතන මගින් 1990 වර්ෂයේ සිට අධිකාරියට පවරා ඇති විවිධ ස්ථානවල පිහිටි මුල් පැවරුම් වටිනාකමක් නොමැති පර්චස් 1,109.15 ක ඉඩම් කොටස් 14 ක් අධිකාරිය විසින් ඵලදායී ලෙස භාවිතා කිරිමට, නියාමනය කිරීමට සහ අධිකාරියට ප්‍රයෝජනවත් නොවන ඉඩම් නැවත පැවරුම් ආයතනවලට පවරා දීමට කටයුතු කර නොතිබුණි. එයින් අනවසර පදිංචිකරුවන් පරිහරණය කරමින් තිබූ පර්චස් 1,173.1 ක් වූ ඉඩම් කොටස් 12 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ වන විට පවරා ගත යුතුව ඇති ඉඩම් කොටස් අයත් විධායක ඉංජිනේරු කාර්යාලවල නිළධාරීන් විසින් ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ඉඩම් නිළධාරීන් හමුවී ඉඩම් පවරා ගැනීම් කටයුතු කඩිනම් කරගැනීම් සඳහා ඉදිරි ක්‍රියා මාර්ග ගනිමින් පවතී. | අදාල ඉඩම්වල අයිතිය නිරවුල්කර පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | මාර්ග සංවර්ධන අධිකාරියෙන් සහ රජයට සම්බන්ධ වෙනත් ආයතන මඟින් අධිකාරියට පවරා ඇති පර්චස් 4,715.23 ක ඉඩම් කොටස් 32 ක් සඳහා පැවරුම් සහතික හෝ ඔප්පු අධිකාරිය සතුව නොතිබුණි. | මේ වන විට පවරා ගත යුතුව ඇති ඉඩම් කොටස් අයත් විධායක ඉංජිනේරු කාර්යාලවල නිළධාරීන් විසින් ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ඉඩම් නිළධාරීන් හමුවී ඉඩම් පවරා ගැනීම් කටයුතු කඩිනම් කරගැනීම් සඳහා ඉදිරි ක්‍රියා මාර්ග ගනිමින් පවතී. | අදාල ඉඩම්වල අයිතිය නිරවුල්කර පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඞ) | රට හදන සෞභාග්‍ය දැක්ම යටතේ ජාතික, ප්‍රාදේශීය හා ග්‍රාමීය වශයෙන් කිලෝමීටර් 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ 2020 / 2022 වර්ෂවලදී කිලෝමීටර් 191.68 ක් පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදුකිරීමට අනුමත කර රු.3,735,709,225 කට ඇස්තමේන්තු සකස්කර තිබූ නමුදු 2022 වර්ෂය අවසන් වන විට කිලෝමීටර් 160 ක මාර්ග පමණක් පුනරුත්ථාපනය නිමකර තිබූ අතර ඒවායේ මූල්‍ය වටිනාකම රු.2,158,198,309 ක් විය. ඉහත ව්‍යාපෘතිය යටතේ මාර්ග 104 ක් පුනරුත්ථාපනය සඳහා ඇස්තමේන්තු කර තිබුණද භෞතික ප්‍රගතිය පරීක්ෂාවේදී සියයට 100 ක් නිම නොකළ ව්‍යාපෘති 04 ක් පැවතුණි. | මෙහි සඳහන් මාර්ග නිම නොකල වැඩ 04 ක් ඇති බව පිළිගන්නා ලද අතර ඉටුකරනු ලැබූ වැඩ සඳහා පමණක් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් මුදල් ලබා ගන්නා ලදී. රටේ පවතින උග්‍ර මුදල් අර්බුදය නිසා 2022 වර්ෂයේ ව්‍යාපෘති නවතා දැමීමට අප වෙත දැන්වීම මෙයට හේතු වූ බව අවධාරණය කරමි. | සැලසුම්කළ පරිදි නියමිත කාල පරිච්ඡේදය තුළ වැඩ ආරම්භ කිරීමට හා අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඟ) | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2020, 2021 හා 2022 යන වර්ෂවලට අදාලව කිලෝ මීටර් 100,000 වැඩසටහන, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා පළාත් සංවර්ධන ප්‍රදාන යටතේ මාර්ග 196 ක මාර්ග සංවර්ධන කටයුතු සඳහා වටිනාකම රු.1,297,864,042 ක් වූ ඉදිකිරීම් ව්‍යාපෘති සිදුකර තිබුණු අතර එයින් මාර්ග 19 ක වටිනාකම රු.176,863,743 ක් වූ ඉදිකිරීම් පමණක් සෘජු ශ්‍රම පදනම යටතේ සිදුකර තිබුණු අතර ඉතිරි සියලු මාර්ගවල සංවර්ධන කටයුතු කොන්ත්‍රාත් පදනම මත බාහිර කොන්ත්‍රාත්කරුවන් මගින් සිදුකර තිබුණි. කෙසේ වුවද අධිකාරියේ ඉංජිනේරු, තාක්ෂණ නිළධාරීන් ඇතුළු 814 ක කාර්ය මණ්ඩලයක් සිටියදී සහ ඉදිකිරීම් සඳහා අවශ්‍ය සියලුම ආකාරයේ යන්ත්‍ර සූත්‍ර හා වාහන තිබියදී සෘජු ශ්‍රම පදනම යටතේ ඉටුකරන ලද ව්‍යාපෘති ප්‍රමාණය සියයට 14 ක් තරම් අවම මට්ටමක පැවතුණි. | රටේ පැවති උග්‍ර මුදල් අර්බුදය නිසා මෙවැනි ව්‍යාපෘති නවතා දැමීමට අප වෙත උපදෙස් ලබා දෙන ලදී. | මානව හා භෞතික සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව යෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | 2017, 2018 හා 2019 වර්ෂයන් වලදී සංවර්ධනය කර තිබූ කොට්ටාව තලගල අදියර 01 හා 02 සහ පිළියන්දල බයිපාස් අදියර 02 ව්‍යාපෘති අවසන් කර වසර ගණනක් වුවද කළ වැඩ වටිනාකම ලෙස ඉදිරිපත් කර තිබූ රු.305,987,602 ක අවසාන බිල්පත් වලට අදාළ විධායක ඉංජිනේරු විසින් මේ දක්වා අනුමැතිය ලබාදී නොතිබුණි. | මෙම ව්‍යාපෘති සඳහා Standing Technical Committee (STC) මිල ගණන් සඳහා ඉදිරිපත් කරන ලද අතර, එම මිල ගණන් අනුමත වී ඇත්තේ වෙළඳපොළ මිලගණන් වලට වඩා අඩුවෙනි. ඒ සඳහා අප අධිකාරිය විසින් 2019/2021/2023 වර්ෂ වලදී ඉල්ලීම් කර ඇතත් එය ඵලදයී වී නොමැත. කෙසේ වෙතත් අවසන් අදියරේ අභියාචනා සලකා බලා කඩිනමින් අප වෙත දැනුම් දෙන බව නාගරික සංවර්ධන අධිකාරිය විසින් දන්වා ඇත. | HSR අනුව හා ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඒ) | මොරගහහේන යාන්ත්‍රික ඉංජිනේරු මධ්‍යස්ථානයේ යන්ත්‍ර සූත්‍ර හා වාහන අළුත්වැඩියා කිරීම සඳහා යකඩ භාවිතයෙන් අංගනයක් 2015 වර්ෂයේදී රු.15,906,290 ක වියදමකින් ඉදිකර තිබුණි. එම අංගනය මැද දෙමහල් කාර්යාල හා ගබඩා ගොඩනැගිල්ලක් සමාලෝචිත වර්ෂය තුළදී ඉදිකිරීම හේතුවෙන් අංගනයේ ඉඩකඩ ඇහිරී තිබුණි. ඒ හේතුවෙන් අංගනය අපේක්ෂිත කාර්ය සඳහා සම්පූර්ණ වශයෙන් භාවිතා කිරීමට නොහැකි වී තිබූ අතර යන්ත්‍ර සූත්‍ර හා වාහන එළිමහනේ නවතා තැබීමටද සිදු වී තිබුණි. ඇස්තමේන්තු වටිනාකම රු.20,603,152 ක් වූ මෙම ගොඩනැඟිල්ල සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.13,211,727 ක වියදමක් දරා තිබුණි. එමෙන්ම අංගනය තුළ ඉදිකරන ලද දෙමහල් කාර්යාල හා ගබඩා ගොඩනැගිල්ලේ බිම් මහලේ උස අඩි 08 ක් තරම් අඩු මට්ටමක පැවතීමෙන් එම ගොඩනැගිල්ල ද, කාර්යාල හා ගබඩා ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මධ්‍යස්ථානයේ ප්‍රමාණවත් ඉඩකඩ තිබියදී එය වාහන අංගනය තුළ ඉදිකිරීම හේතුවෙන් වාහන අංගනයද කාර්යක්ෂමව හා | මෙවැනි තත්වයන් නැවත උද්ගත නොවීමට උපදෙස් සහිත චක්‍රලේඛයක් නිකුත් කර ඇත. | වඩාත් ඵලදායී හා ආර්ථිකමය ප්‍රතිලාභ ලැබෙන ආකාරයට සැලසුම් සකස් කළ යුතු අතර නොසැලකිලිමත්ව කටයුතු කිරීම නිසා සිදුවන අලාභ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඵලදායීව භාවිතයට ගැනීමට නොහැකි තත්ත්වයක පැවතුණි. | | |
| **(ඔ)** | පිරිවැය රු.26,000,000 ක් වූ මාර්ග පිරිසිදු කිරීමේ යන්ත්‍රය 2020 වර්ෂයේදී රු.450,000 කට ප්‍රත්‍යාගණන කමිටුව මඟින් ප්‍රත්‍යාගණනය කර අපහරණය කිරීමට නිර්දේශ කර තිබුණි. මෙම යන්ත්‍රය අපහරණය කිරීම සඳහා නිර්දේශකර රු.450,000 ක් තරම් වූ අවම වටිනාකමකට තක්සේරු කිරීමත්, අපහරණය කිරීම සඳහා නිර්දේශ කර තිබූ යන්ත්‍රය පසුව රු.2,000,000 වියදමකින් අළුත්වැඩියා කර තිබීමත් මත තක්සේරු කමිටුව තම වෘත්තීමය වගකීම නිසි ලෙස ඉටු නොකිරීමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය කෙරේ. | 2020 වර්ෂයේ ප්‍රත්‍යාගණන කරන අවස්ථාවේදී මෙම යන්ත්‍රය මෝටර් වාහන යටතේ ප්‍රත්‍යාගණනය කළ අතර එම ප්‍රත්‍යාගණන කමිටුව යන්ත්‍රය පරීක්ෂා කරන අවස්ථාවේදී වැසියේ දිරුම් පැවති අතර එන්ජිම හා මෙම රථය 2020 දී ප්‍රත්‍යාගණනය කරන ලද්දේ රු.450,000 මුදලකටය. | වත්කම් නිවැරදිව ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ඕ)** | ඉහත යන්ත්‍රය මිලදී ගත් 2011 වර්ෂයේ සිට යන්ත්‍ර පැය 406 ක් පමණක් සේවයේ යොදාගෙන තිබියදී සහ 2012 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව තිබියදීත්, නිරන්තරයෙන් සේවයේ යොදාගන්නා යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියා කිරීම සඳහා අංගනවල තිබියදීත් මෙම යන්ත්‍රයට රු.2,000,000 ක් වියදම්කර අළුත්වැඩියා කිරීමට ප්‍රමුඛතාවය ලබා දීමත් අමතර කොටස්වල මිල ගණන් ඉහළ මට්ටමක පවතින මෙම කාලය තුළදී නිෂ්ක්‍රීයව පවතින යන්ත්‍රය සඳහා බ්‍රෂ් කට්ටල 10 ක් මිලදී ගැනීමට නිර්දේශ කර තිබීමත් ගැටළුසහගත ලෙස නිරීක්ෂණය කෙරේ. | මාර්ග සංවර්ධන අධිකාරිය බ්‍රෂ් යන්ත්‍රය කුලී පදනම මත ලබා ගැනීමට එකඟතාවය පලකර නොමැති බැවින් මෙම යන්ත්‍රය කුලී පදනම ලබා දීම සඳහා ආයතන කිහිපයකට මිල ගණන් ඉදිරිපත් කර ඇත. | වත්කම් මිලදී ගැනීම ආයතනයේ අවශ්‍යතාවයන් මත තීරණය විය යුතුය. |
| **(ක)** | වටිනාකම රු.158,000,000 වූ කොන්ක්‍රීට් ඇතුරුම් යන්ත්‍ර 02 ක් 2012 වර්ෂයේදී අධිකාරිය විසින් මිලදී ගෙන තිබුණි. ඉන් එක් යන්ත්‍රයක් මිලදී ගත් දිනයේ සිට කිසිදු කාර්යකට යොදා නොගෙන නිෂ්ක්‍රීය වත්කමක් බවට පත්කර තිබූ අතර අනෙක් යන්ත්‍රය මිලදී ගත් දිනයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වූ වසර 10 ක කාලය තුළ මාර්ග 15 ක යන්ත්‍ර පැය 420 ක ඉදිකිරීම් සඳහා පමණක් භාවිතා කර තිබීමෙන් ඌන | 2022 සහ 2023 වර්ෂයේ කොන්ක්‍රීට් ඇතුරුම් යන්ත්‍රය මගින් ව්‍යාපෘති කිහිපයක් ඉටුකර ඇත. | වත්කම් අවශ්‍යතාවය අනුව මිලදීගත යුතු අතර උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | උපයෝජිත යන්ත්‍රයක් බවට පත්කර තිබුණි. | | |
| (ග) | 2012 වර්ෂයේදී රු.6,000,000 කට මිලදී ගෙන තිබූ කර්බ් යන්ත්‍රය මිලදී ගත් දිනයේ සිට කිසිම ව්‍යාපෘතියක සේවයේ යොදවා ගැනීමකින් තොරව දිවුලපිටිය පෙරනිම් අංගනයේ ගාල්කර තිබීමෙන් එම යන්ත්‍රය නිෂ්ක්‍රීය වත්කමක් බවට පත්වී තිබුණි. | 2023 වර්ෂයේ විධායක ඉංජිනේරු කොට්ඨාශ මට්ටමින් Curb Wall ඉදිකිරීමට උපදෙස් ලබාදී දැනට ඉටුකරමින් පවතී. | වත්කම් අවශ්‍යතාවය අනුව මිලදීගත යුතු අතර උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ච) | 2012 වර්ෂයේදී ඇස්පෝල්ට් නිෂ්පාදනයට තාර උණු කිරීම සඳහා සපයා තිබූ රු.27,800,000 ක වටිනාකමින් යුත් Decanting යන්ත්‍රය ස්ථාපනය කර වසර 10 ක් ගත වී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා තාර 535,680 Kg ක් පමණක් නිෂ්පාදනයට උපයෝජනය කර තිබුණු අතර යන්ත්‍රය මිලදී ගැනීමේදී ආයතනයට ඇති ආර්ථිකමය වාසිය ගැන අවධානය යොමුකර නොතිබුණි. | තාර ලීටරයක් සඳහා Bulk ලබා ගැනීමේදී මිල රු.93.45 වන අතර බැරල් මගින් ලබාගැනීමේදී එම මුදල රු.106.43ක් බව ගණනය කරන ලදී. එම ගණනය කිරීම් මත පිහිටා සිටිමින් Bulk වශයෙන් තාර ලබා ගැනීම ඉටුකර ඇති බව දන්වමි. | වත්කම් මිලදී ගැනීමේදී ආර්ථිකමය වටිනාකම සලකා බැලිය යුතුය. |

### 1.5.6.3 සමුපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදල

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බස්නාහිර පළාතේ 2010 අංක 06 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීතිවල 05 හා 06 වගන්ති අනුව ප්‍රඥප්තිය ක්‍රියාත්මක දිනට වයස අවුරුදු 56 ඉක්මවූ සේවකයෙකුට රීතිවල උපලේඛණ II ප්‍රකාරව විශ්‍රාම වැටුප් හිමිකම විය යුත්තේ විශ්‍රාම යන වයසේ ලැබූ ඒකාබද්ධ වැටුපෙන් සියයට 40 ක ප්‍රමාණයක් වුවද සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට වයස අවුරුදු 56 ඉක්මවූ පළාත් සමුපකාර විශ්‍රාම වැටුප් අරමුදලේ සේවකයින් 211 දෙනෙකුට සියයට 40 කට වඩා වැඩි ප්‍රතිශතයකින් විශ්‍රාම වැටුප් ගෙවා තිබීම සහ විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීතීන් හි වගුවේ සඳහන් ආකාරයට වාරික හා වයස පදනම්කරගෙන ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයකින් විශ්‍රාම වැටුප් ගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.67,145,714 ක් විශ්‍රාම වැටුප් | සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියේ 14 යටතේ ඇති පාලන මණ්ඩලය විසින් ඉදිරියේදී විශ්‍රාම වැටුප් ලබාදීමේදී ගෙවා ඇති විශ්‍රාම වැටුප් වාරික ගණන දායකත්වය ලබාදුන් දින සිට ගණනය කිරීමට තීරණය කරන ලදී. | විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීතීන් හි වගුවේ සඳහන් ආකාරයට වාරික හා වයස පදනම්කරගෙන විශ්‍රාම වැටුප ගණනය කළ යුතුය. |

ලෙස වැඩියෙන් ගෙවා තිබුණි. මෙම තත්ත්වය සමුපකාර සේවකයන්ට තම දායකත්වය මත විශ්‍රාම වැටුප් ගෙවීමට අරමුදල ප්‍රමාණවත් නොවීමේ ගැටළුවකට අනාගතයේදී හේතුවිය හැකි බවද නිරීක්ෂණය විය.

**1.5.7 ශීර්ෂය 108 - අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රීඩා කටයුතු සඳහා පවත්වාගෙන යනු ලබන ගම්පහ සිරිමාවෝ බණ්ඩාරනායක ක්‍රීඩා සංකීර්ණයට අයත් ඉඩම සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අමාත්‍යාංශයට පවරාගෙන නොතිබුණි. | පැවරීමට හැකියාවක් නොමැති බව ගම්පහ ප්‍රාදේශීය ලේකම් විසින් ලිඛිතව දන්වා ඇත. | ඉඩම් පවරා ගැනීමෙන් තොරව සංවර්ධන කටයුතු සිදු නොකළ යුතුය. |

**1.5.8 ශීර්ෂය 109 - ප්‍රධාන ලේකම් කාර්යාලය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ නිලධාරීන්ට රජයේ නිවසක් ලබාදීම කළ හැකි වුවද ආයතන සංග්‍රහය අනුව මාසික නිවාස කුලී ලෙස දීමනාවක් ගෙවීමට කිසිදු හැකියාවක් නොමැති වුවද ඒ පිළිබඳ අවධානය යොමු කිරීමකින් තොරව නිල නිවාස ඉදිකරන තෙක් තාවකාලික ගෙවීමක් ලෙස දක්වමින් බස්නාහිර පළාත් සභාවේ ඉහළම තනතුරු දරන නිලධාරීන් 11 දෙනෙකුට වසර 05 කට වැඩි කාලයක සිට රු.20,054,032 ක මාසික නිල නිවාස කුලී දීමනාවක් ගෙවා තිබුණද නිල නිවාස ඉදිකිරීමට එකී වසර 05 තුළ සැලසුමක් හෝ අනුමත කරගෙන නොතිබුණි. | අංක Vi/100/11-2017-01(iii) දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා ඒ සඳහා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19(5) යටතේ ගරු ආණ්ඩුකාරතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දීමනා ගෙවනු ලැබේ. | ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2014 ජනවාරි 01 දිනැති අංක 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3(II) ඡේදය අනුව රජයේ නිලධාරීන් සඳහා ඉන්ධන දීමනාව ගෙවීමේදී අදාළ මාසයේ | ප්‍රධාන ලේකම් කාර්යාලයේ නිල වාහන හිමි නිලධාරීන් සඳහා ඉන්ධන දීමනා ලබා දීමේදී ඒ පිළිබඳව උපදෙස් | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පළමු දින ශ්‍රී ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ප්‍රකාශිතව පැවැති සාමාන්‍ය පෙට්‍රල් හා ඩීසල් මිල ගණන් මත පදනම්ව ගණනය කළයුතු වේ. එකී උපදෙස් සැලකිල්ලට නොගෙන 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008(IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව නිල වාහන හිමිකම් ලබන නිලධාරීන් 52 දෙනෙකුට මාසයේ පළමු දිනට පවතින ඉන්ධන ලීටරයක මිල ලෙස සුපිරි පෙට්‍රල්වල සහ සුපිරි ඩීසල්වල මිල පදනම් කරගෙන මාසික ඉන්ධන දීමනාව ගණනය කර 2011 වර්ෂයේ සිට 2022 ඔක්තෝබර් මාසය දක්වා කාලය තුළ රු.6,183,569 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ලබා දී ඇති 2011 පෙබරවාරි 09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2008 (IV) ප්‍රකාරව ඉන්ධන දීමනා ගෙවීමේ කටයුතු සිදු කර ඇත. එම චක්‍රලේඛයේ ඉන්ධන සම්බන්ධව දක්වා ඇති කරුණු වල කිසිදු ආකාරයක ඉන්ධන වර්ගයක් පිළිබඳව දක්වා නොමැති බව කාරුණිකව දන්වමි. | |
| (ඇ) | පළාත් සභා අරමුදලින් කෙරෙන සියලු භාණ්ඩ, වැඩ හා සේවා සැපයීම සඳහා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය අදාළ කරගත යුතු වුවත් බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ ආරක්ෂක සේවාව, වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය වෙත ලබාදීමේදී රු.48,887,800 ක කොන්ත්‍රාත්තුව සඳහා ප්‍රසම්පාදනයන් සිදු නොකර ගිවිසුමක් මඟින් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබූ අතර ඔවුන්ගේ මිල රේටයන් සාමාන්‍ය වෙළඳපලේ පවතින රේටයන්වලට වඩා ඉතා ඉහළ අගයක් ගෙන තිබුණු අතර 2022 වර්ෂයේ මාසික බිල්පත් වටිනාකම රු.ලක්ෂ 49 ක් පමණ වී තිබුණි. | අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ඇත. පළාත් සභාවක් නොමැති බැවින් 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වාම ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන ඇත. | මූල්‍ය රීති හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත පමණක් බස්නාහිර පළාත් සභාවට සහ බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල දීපව්‍යාප්ත තනතුරු සඳහා නිලධාරීන් | මේ වනවිට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව. | කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික නිලධාරීන් නැවත සේවයට යෙදවීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත |

| | | | |
|---|---|---|---|
| | 50 දෙනෙකු නීත්‍යානුකූල නොවන ආකාරයට කොන්ත්‍රාත් පදනම මත, විශ්‍රාමික නිලධාරීන් නැවත සේවයට යෙදවීම සහ එකී නිලධාරීන්ගේ කොන්ත්‍රාත් කාලය එලෙසම දීර්ඝ කිරීමට කටයුතු කර තිබුණි. | | යුතුය. |
| (ඉ) | පිරිස් හා පුහුණු අංශය වෙත MIS මෘදුකාංගයක් ස්ථාපනය කිරීම සඳහා 2021 වර්ෂයේ රු.2,300,000 කුත් 2022 වර්ෂයේ රු.2,700,000 කුත් වශයෙන් එකතුව රු.5,000,000 ක් වියදම් කර තිබුණු නමුත් අදාළ මෘදුකාංග පද්ධතිය 2023 මැයි වනවිටත් ප්‍රයෝජනයට ගැනීමක් සිදුකර නොතිබුණි. | දත්ත ඇතුළත් කිරීමේ කටයුතු සියයට 85 ක් පමණ මේ වනවිට අවසන් කර ඇත. | පරිගණක මෘදුකාංග පද්ධතියෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | පළාත් සභාවේ නිල කාලය අවසන් වීමෙන් පසු පළාත් අමාත්‍ය මණ්ඩලයක් නොමැති අවස්ථාවකදී ප්‍රධාන ලේකම් විසින් අමාත්‍ය මණ්ඩල ලේකම් වශයෙන් කටයුතු කිරීම වෙනුවෙන් මසකට රු.15,000 ක් වන පරිදි දීමනාවක් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත අවිධිමත් ලෙස ගෙවීම් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එසේ අවිධිමත් ලෙස ගෙවීම් කර තිබුණු මුළු දීමනාව රු.345,000 ක් විය. | ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි සෘජුව ප්‍රධාන ලේකම්වරයා යටතේ ඇති පළාත් අමාත්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය මගින් බැවින් පෙර අවස්ථාවන්ට වඩා ප්‍රධාන ලේකම් තනතුරේ රාජකාරිවලට අතිරේකව විශාල වගකීමක් හා කාර්යභාරයන් කොටසක් ඉටු කිරීමට සිදුවන බව පෙන්වා දෙමි. | දීමනා සඳහා විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.9 ශීර්ෂය 112 - පළාත් පාලන දෙපාර්තමේන්තුව**

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ පිහිටි පළාත් පාලන බල මණ්ඩල 49 ක 2022 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම රු.9,209,439,610 ක් විය. | අයකර ගනිමින් පවතී. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මහා නගර සභා 03 ක නිලධාරීන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් පනවන ලද අධිභාර 13 කට අදාලව 2022 දෙසැම්බර් 31 දිනට අයකර ගතයුතු වටිනාකම රු.26,642,251 ක් විය. | අදාළ කටයුතු සිදු කරමින් පවතී. | අධිභාර සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.5.10 ශීර්ෂය 113 - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් මූල්‍ය රීති 41.1. (ආ) හා 91.1.6 විධිවිධාන ප්‍රකාරව ගාස්තු ප්‍රමාණ වෙනස්කිරීම මඟින් ආදායම් වැඩිකිරීම සඳහා වූ හැකියාව සොයාබැලීම සහ සැපයුම් හා සේවා සඳහා අයකිරීම් ගාස්තු යනාදිය පවත්නා ආර්ථික හා වෙනත් තත්ත්වයන් පිළිබඳව සලකා බලා කලින් කල සමාලෝචනය කර ප්‍රතිශෝධනය කළ යුතුව තිබුණද, වෛද්‍ය සහතික නිකුත් කිරීමේ ගාස්තු 2009 ජුනි 11 න් පසු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 13 ක කාලයක් ගතවී තිබුණද නැවත ප්‍රතිශෝධනය කිරීමට පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව පියවර ගෙන නොතිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති නිරීක්ෂණය හා එකඟ වේ. | පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් වංචා 04 කට අදාළව රු.1,316,457 ක්ද ගිණි හානි 02 කට අදාළව රු.455,492 ක්ද වෙනත් හානියකට අදාළව රු.792,000 ක්ද වාහන අනතුරු 87 කට අදාළව රු.26,472,142 ක්ද අයවිය යුතුව පැවති අතර මෙම මුළු හානිවලින් රු.29,646,047 ක් වටිනා හානි 49 ක් අවුරුදු 10 ට වඩා පැරණි ඒවා නමුදු එකී අලාභ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානයටත් නොහැකි වී තිබුණි. | අලාභ හානි ගොනු නිරවුල් කිරීම සම්බන්ධයෙන් මේ වනවිට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | අලාභ හානි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.11 ශීර්ෂය 114 - ආයුර්වේද දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මීගොඩ ආයුර්වේද රෝහලේ X-Ray ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා රු.5,518,305 ක් වැයකර 2016 වර්ෂයේදී එකී ගොඩනැගිල්ල විවෘත කර තිබුණු අතර රු.1,736,500 ක | යන්ත්‍රය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මඟින් මිනුවන්ගොඩ රෝහලට ලබාදුන් බව. | රෝහලේ අවශ්‍යතාවය සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වියදම් දරා උපකරණද මිලදී ගෙන තිබුණද එම උපකරණ මෙහෙයවීමට විකිරණ ශිල්පියෙක් නොමැතිවීම නිසා රෝගීන් හා කාර්යය මණ්ඩලය අපහසුතාවයට පත්වී තිබුණි. එම හේතුව මත 2008 වර්ෂයේදී රු.1,092,500 කට මිලදීගෙන තිබූ Portable X-Ray යන්ත්‍රය හා රු.644,000 කට මිලදීගෙන තිබූ X-Ray Film Processor යන්ත්‍රය 2022 ඔක්තෝබර් මාසයේදී මීනුවන්ගොඩ මූලික රෝහල වෙත ලබා දී තිබුණි. ඒ අනුව උපකරණ මිලදී ගෙන වසර 14 ක් පමණ දීර්ඝ කාලයක් භාවිතයට නොගෙන පැවති බව නිරීක්ෂණය වූ අතර ඉදිකරන ලද කාමරය වෙනත් අබලි භාණ්ඩ හා වෙනත් භාණ්ඩ ගබඩා කිරීමට මේ වනවිට කටයුතු කර තිබුණි. | | |
| (ආ) | මීගොඩ ආයුර්වේද රොහලේ රසායනාගාර කාර්මික ශිල්පියෙකු නොමැති වීම මත වසර 05 ක කාලයක සිට රසායනාගාරයක් ක්‍රියාත්මක නොවන අතර එහි පැවති භාවිතයට ගත හැකි මට්ටමේ පැවති උපකරණ වර්ග 31 කට අදාළ රසායනාගාර උපකරණ අයිතම 57 ක් හා රසායනික ද්‍රව්‍ය ඌණ උපයෝජිතව පැවතුණි. තවද බස්නාහිර පළාත් අයුර්වේද කොමසාරිස්ගේ අංක බප/ආයු/ගි11/හස/02 iv හා 2022 ඔක්තෝබර් 07 දිනැති අමාත්‍යාංශ ලේකම් අමතන ලිපිය මගින් මෙම භාණ්ඩ රසායනාගාර පහසුකම් සහිත බටහිර රෝහලක් වෙත ලබාදීමට කටයුතු කරන ලෙස දක්වා තිබුණද, රෝහල සඳහා රසායනාගාරයක දැඩිව අවශ්‍යතාවයක් ඇති බැවින් අදාළ රසායන ශිල්පියෙක් තාවකාලිකව අනුයුක්ත කිරීම හෝ සුදුසු නිලධාරියෙකු පුහුණු කර තාවකාලිකව කටයුතු කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | ඉදිරියේදී රසායනාගාර කටයුතු පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | රසායනාගාරය ක්‍රියාත්මක කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

### 1.5.12 ශීර්ෂය 115 - සමාජ සේවා දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මීරිගම "සෙත් සෙවන" වැඩිහිටි නිවාසයේ ගජබා අංශයේ පිහිටි ගොඩනැගිල්ලේ වහලය හා බිත්තිය අලුත්වැඩියා කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.17,456,379 ක් වැයකර තිබුණද එම ගොඩනැගිල්ලේ අනෙකුත් අවශ්‍යතා වන දොරවල් හා ජනෙල් සවිකර නොතිබීම හේතුවෙන් 2023 මැයි වනවිටත් භාවිතයට ගත නොහැකිව පැවතුණි. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත ඉදිරි කටයුතු කළ නොහැකි වූ බව. | කඩිනමින් භාවිත තත්ත්වයට ගත යුතුය. |
| (ආ) | 2019 දෙසැම්බර් මස රු.4,351,357 ක් වැයකර අලුත්වැඩියා කර තිබුණු මීරිගම සෙත් සෙවන වැඩිහිටි නිවාසයේ අධිකාරී සඳහා වෙන්කළ නිල නිවස සඳහා අවශ්‍ය ජල පහසුකම් නොමැති වීම නිසා වසර 03 කට අධික කාලයක් එම නිල නිවස භාවිතයට ගත නොහැකිව පැවතුණි. | ජල පිරිපහදු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක අතර එය නිමවූ පසු ගැටළුව විසඳෙන බව. | කඩිනමින් භාවිත තත්ත්වයට ගත යුතුය. |

### 1.5.13 ශීර්ෂය 116 - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාකොළ සහතික කළ පාසලේ පරිගණක ඒකකය, සුළු සේවක නිවාසය සහ 2021 වර්ෂයේ රු.11,222,740 ක වියදමක් දරා ඉදිකළ ක්‍රීඩාගාරය 2023 ජුනි මාසය වනවිටත් නිශ්කාර්යව පැවතුණි. | ක්‍රීඩාගාරය භාවිතා කිරීමට කටයුතු කරන බවත් තිස්ස නේවාසිකාගාරය භාවිතා තත්ත්වයේ තිබෙන බවත් සුළු සේවක නිවාසය භාවිතා කළ නොහැකි මට්ටමේ පවතින බව. | කඩිනමින් භාවිතා තත්ත්වයට පත්කළ යුතුය. |

**1.5.14 ශීර්ෂය 126 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ, ජයවර්ධනපුර, පිළියන්දල, හා හෝමාගම කලාප අධ්‍යාපන කාර්යාල 04 හි පාසල් 42 ක් ද, ගම්පහ දිස්ත්‍රික්කයේ කැළණිය, මීනුවන්ගොඩ, ගම්පහ හා මීගමුව කලාප අධ්‍යාපන කාර්යාල 04 හි පාසල් 44 ක් සහ කළුතර දිස්ත්‍රික්කයේ කළුතර, මතුගම හා හොරණ කලාප අධ්‍යාපන කාර්යාල 03 හි පාසල් 45 ක් ද ප්‍රමාණවත් සිසුන් නොමැති වීම හේතුවෙන් වසා දමා තිබුණි. ඒ අතර කළුතර දිස්ත්‍රික්කයේ කළුතර හා මතුගම කලාපයන්හි පාසල් 02 ක් ද, ගම්පහ දිස්ත්‍රික්කයේ මීනුවන්ගොඩ කලාපයෙහි පාසල් 02 ක් ද 2022 වර්ෂයේදී වසා දමා තිබුණි. | පාසල් වැසී යාමට මූලිකම හේතුව බවට පත්ව ඇත්තේ අවම ශිෂ්‍ය සංඛ්‍යාවක් සහිත වීමයි. අවම ශිෂ්‍ය සංඛ්‍යාවක් සහිතව පාසල් පවත්වා ගෙන යාමේ අවාසි දායක තත්ත්වය සමනය කර ගැනීම සඳහා හා ශිෂ්‍ය ප්‍රජාවට වඩා ඵලදායි පාසල් පද්ධතියක ඉගෙනුම් අවස්ථා උදාකරලීමේ අරමුණින් මෙසේ පාසල් වසා දැමීමට සිදුව ඇත. | පාසල් වසා දැමීම වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගතයුතු අතර ග්‍රාමීය පාසල් නගා සිටුවීමටද කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ කලාපයෙහි පාසල් 16 ක ගොඩනැගිලි ඉදිකිරීමට අදාළ මුදල් ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන්ද, මහාබෝධි මහා විද්‍යාලය කොන්ත්‍රාත්කරු අතහැර දැමීමෙන්ද, ප්‍රෙස්බටීරියන් බාලිකා විද්‍යාලය නඩු පැවරීම හේතුවෙන්ද පාසල් ගොඩනැගිලි 18 ක් අඩක් නිම කළ ගොඩනැගිලි ලෙස පැවති අතර ශ්‍රී ජයවර්ධනපුර කලාපයෙහි ගොඩනැගිලි ඉදිකිරීම වෙනුවෙන් ඇස්තමේන්තුගත මුදල රු.492,600,000 ක් වූ පාසල් 17 ක් සඳහා ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන්ද අඩක් නිමව පැවතුණි. තවද හෝමාගම කලාපයෙහි 2015 වර්ෂයේ වැඩ ආරම්භ කරන ලද පාසල් 14 න් පාසල් 13 ක් සඳහා ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් ද, එම ගොඩනැගිලි අඩක් නිමව පැවතුණි. | සමස්තයක් ලෙස ගත්විට 2020 වර්ෂයේ සිට පළාත් සහා ප්‍රතිපාදනවලින් ඉදිකිරීම් සඳහා වන මූලධන වියදම් ප්‍රතිපාදන වෙන් කිරීම සීමා කිරීම නිසා මෙම ගොඩනැගිලි සම්පූර්ණයෙන් සාදා නිම කිරීමට නොහැකිවී ඇත. | ප්‍රමුඛතාවය අනුව අඩක් නිම කල ගොඩනැගිලි නිම් ගොඩනැගිලි බවට පත්කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ කලාපයෙහි ප්‍රතිපාදන අනුමත නොවීම හේතුවෙන් පාසල් 06 කද, ප්‍රතිපාදන නොලැබීම හා ප්‍රතිපාදන ලැබීමට ප්‍රමාද වීම හේතුවෙන් පාසල් 07 කද ගොඩනැගිලි අඩක් නිමව පැවති අතර මිනුවන්ගොඩ කලාපයෙහි 2011 වර්ෂයේ සිට ආරම්භ කරන ලද පාසල් 07 කට අදාළ ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් අඩක් නිමව පැවතුණි. තවද මීගමුව කලාපයෙහි ප්‍රතිපාදන නොමැති වීම මත පාසල් 06 ක ගොඩනැගිලි අඩක් නිමව පැවති අතර, එහි නිමි ප්‍රතිශතය සියයට 18 ත් සියයට 80 ත් අතර පැවතුණි. | සමස්තයක් ලෙස ගත් විට 2020 වර්ෂයේ සිට පළාත් සභා ප්‍රතිපාදන වලින් ඉදිකිරීම් සඳහා වන මූලධන වියදම් ප්‍රතිපාදන වෙන් කිරීම සීමා කිරීම නිසා මෙම ගොඩනැගිලි සම්පූර්ණයෙන් සාදා නිම කිරීමට නොහැකිවී ඇත. බොහෝ ගොඩනැගිලි අදියර වශයෙන් නිමකර භාවිතයට ගන්නා අතර, ලැබෙන මුදල් ප්‍රමාණය අනුව, අදියර වශයෙන් මෙම ගොඩනැගිලි පරිහරණයට ගන්නා තත්ත්වයට පත් කිරීමට ප්‍රාදේශීය ඉංජිනේරු විසින් කටයුතු කරනු ලැබ ඇත. | ප්‍රමුඛතාවය අනුව අඩක් නිම කල ගොඩනැගිලි නිමි ගොඩනැගිලි බවට පත්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | කළුතර දිස්ත්‍රික්කයේ හොරණ කලාපයෙහි පාසල් 29 ක අඩක් නිමි ගොඩනැගිලි අතරින්, ඉදිකිරීමේ ප්‍රගතිය සියයට 10 ට අඩු ගොඩනැගිලි 06 ක් පැවති අතර, මතුගම කලාපයෙහි 2014 වර්ෂයේ සිට ඉදිවෙමින් පවතින ගොඩනැගිලි 18 ක නිමි ප්‍රතිශතය සියයට 45 ත් සියයට 95 ත් අතර පරාසයක පැවතුණි. | සමස්තයක් ලෙස ගත් විට 2020 වර්ෂයේ සිට පළාත් සභා ප්‍රතිපාදන වලින් ඉදිකිරීම් සඳහා වන මූලධන වියදම් ප්‍රතිපාදන වෙන් කිරීම සීමා කිරීම නිසා මෙම ගොඩනැගිලි සම්පූර්ණයෙන් සාදා නිම කිරීමට නොහැකිවී ඇත. | ප්‍රමුඛතාවය අනුව අඩක් නිම කල ගොඩනැගිලි නිමි ගොඩනැගිලි බවට පත්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | කොළඹ, කළුතර හා ගම්පහ යන දිස්ත්‍රික්කවල බස්නාහිර පළාත් සභාවෙන් පාලනය වන පාසල්වල සිසුන් විසින් පෙනී සිටි පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස.(සා.පෙළ) විභාගය හා අ.පො.ස.(උ.පෙළ) විභාගය යන විභාගවලදී අසමත් සිසුන් සංඛ්‍යාව වසරින් වසර ක්‍රමිකව අඩුකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබීම මත පහත දැක්වෙන ආකාරයට 2022 වර්ෂයේ පැවති එක් එක් විභාගවලදී සිසුන් විභාග අසමත් වී තිබුණි. | | |

| | | | | |
|---|---|---|---|---|
| | (i) | බස්නාහිර පළාතේ පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි 75,223 ක් වන මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සිසුන් 11,792 ක් ලකුණු 80 ට අඩුවෙන් ලබාගෙන තිබීම මත විභාගය අසමත්ව තිබුණි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 15.7 ක් විය. | නිරීක්ෂණ පිළිගනිමි. | සිසුන්ගේ සාධන මට්ටම වැඩි කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| | (ii) | බස්නාහිර පළාතේ පළමුවරට අ.පො.ස.(සා.පෙළ) විභාගයට පෙනී සිටි 51,423 ක් වන මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සිසුන් 16,195 ක් අ.පො.ස.(උ.පෙළ) විභාගය හැදෑරීම සඳහා සුදුසුකම් ලබා නොතිබුණි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 31.5 ක් විය. | නිරීක්ෂණ පිළිගනිමි. | අ.පො.ස.(සා/පෙළ) විභාගය සමත්වීමේ ප්‍රතිශතය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| | (iii) | බස්නාහිර පළාතේ පළමුවරට අ.පො.ස.(උ.පෙළ) විභාගයට පෙනී සිටි 23,482 ක් වන මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සිසුන් 3,521 ක් මූලික විෂයයන් 03 අසමත් වී තිබුණි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 15 ක් විය. | නිරීක්ෂණ පිළිගනිමි. | අ.පො.ස.(උ/පෙළ) විභාගය සමත්වීමේ ප්‍රතිශතය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | | කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ, ජයවර්ධනපුර, පිළියන්දල, හා හෝමාගම කලාප අධ්‍යාපන කාර්යාල 04 ට අයත් විදුහල්පති නිල නිවාස 89 න් 16 ක් ද, ගුරු නිවාස 35 න් 08 ක් ද, ගම්පහ දිස්ත්‍රික්කයේ කැළණිය, මිනුවන්ගොඩ, ගම්පහ හා මීගමුව කලාප අධ්‍යාපන කාර්යාල 04 ට අයත් විදුහල්පති නිල නිවාස 13 න් 06 ක් ද, ගුරු නිවාස 34 න් 08 ක් ද, කළුතර දිස්ත්‍රික්කයේ කළුතර, මතුගම හා හොරණ කලාප අධ්‍යාපන කාර්යාල 03 ට අයත් විදුහල්පති නිල නිවාස 27 න් 08 ක් ද, ගුරු නිවාස 163 න් 30 ක් ද නිල නිවාස ලෙස භාවිතා නොකිරීම හේතුවෙන් නිල නිවාස කුලී වශයෙන් ලබාගත හැකිව තිබූ ආදායම් අහිමිව තිබුණි. | ප්‍රාදේශිය ඉංජිනේරු විසින් කඩා ඉවත් කරන ලෙස නිර්දේශ කරන ලද නිල නිවාස භාවිතා නොකරන තත්ත්වයක ඇත. සමහර නිල නිවාස භාවිතය සඳහා ඉල්ලුම් කර නොමැති අවස්ථා ද ඇත. | නිල නිවාස භාවිතයට ගත හැකි මට්ටමට වැඩි දියුණු කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | කොළඹ දිස්ත්‍රික්කයේ කලාප අධ්‍යාපන කාර්යාල 04 ට අයත් විදුහල්පති නිල නිවාස 89 න් 06 ක්ද, ගුරු නිවාස 35 න් 02 ක් ද, ගම්පහ දිස්ත්‍රික්කයේ කලාප අධ්‍යාපන කාර්යාල 04 ට අයත් විදුහල්පති නිල නිවාස 13 න් 01 ක් ද, ගුරු නිවාස 34 න් 02 ක් ද, කළුතර දිස්ත්‍රික්කයේ කලාප අධ්‍යාපන කාර්යාල 03 ට අයත් විදුහල්පති නිල නිවාස 27 න් 05 ක් ද, ගුරු නිවාස 163 න් 35 ක් ද, නිල නිවාස ලෙස භාවිතයට නොගෙන එකී නිවාස අදාළ විද්‍යාලයේ වෙනත් කාර්යන් සඳහා යොදාගෙන තිබූ බැවින්, නිල නිවාස 51 ක් විදුහල්පතිවරුන්ට හා ගුරුවරුන් හට ලබා නොදීම මත අදාළ විද්‍යාලවල සේවය කරන විදුහල්පතිවරුන්ට හා ගුරුවරුන්ට විදුහල ආසන්නයේ නිල නිවසක පදිංචි වී පහසුවෙන් රාජකාරී කටයුතු කිරීමට තිබූ අවස්ථාවන් හා පළාත් සභාවට කිසියම් ආදායමක් ලබා ගැනීමට තිබූ අවස්ථාවන්ද අහිමි වී තිබුණි. | පාසල් ගොඩනැඟිල්ලක් කඩා ඉවත් කර නව ගොඩනැඟිල්ලක් තාවකාලික පන්ති කාමර සඳහා යොදා ගැනීම, පාසලේ ඉඩකඩ මදි වීම නිසා ක්‍රියාකාරකම් කාමර ලෙස යොදා ගැනීම පාසලේ ඉඩ කඩ මදී වීම නිසා පාසල් ගොඩනැඟිල්ලක් ලෙස ස්ථිරවම යොදා ගැනීම වැනි කාර්යයන් සඳහා නිල නිවාස යොදා ගෙන ඇත. | විදුහල්පති නිල නිවාස සහ ගුරු නිවාස, නිල නිවාස ලෙස භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | බස්නාහිර පළාතට අයත් විදුහල්පති නිල නිවාස 129 න් 21 ක් ද, ගුරු නිවාස 232 න් 74 ක්ද කඩිනමින්ම අලුත්වැඩියා කටයුතු කලයුතුව තිබූ නමුදු එම අළුත්වැඩියාවන් කිරීමට කටයුතු කර නොතිබුණි. | අලුත්වැඩියා කළ යුතු නිල නිවාස එසේ කිරීමට හේතු ලෙස ඇස්තමේන්තු කැඳවා තිබෙන නමුත් ප්‍රතිපාදන ලැබී නොමැති වීම. | කඩිනමින් නිල නිවාස අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය. |
| (එ) | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘති (GEMP) යටතේ ග්‍රීන්පාත් පුහුණු මධ්‍යස්ථානය සඳහා 2021 වර්ෂය තුළ මිලට ගෙන තිබූ රු.10,490,862 ක් වටිනා භාණ්ඩ 2022 දෙසැම්බර් 31 දින වනවිට වර්ෂයකට අධික කාලයක් නිශ්කාර්යව පැවතුණි. | දැනට විදු ප්‍රදර්ශනයක් සහ වැඩමුළු දෙකක ආරම්භක වැඩසටහන් මෙම මධ්‍යස්ථානයේ සිදු කරන ලදී. | රු.10,490,862 ක්වූ මූල්‍ය නොවන වත්කම්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.15,215,880,246 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.11,649,854,163 ක් විය. ඒ අනුව අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,566,026,083 ක වර්ධනයක් ඇති වී තිබුණු අතර එම වර්ධනය සඳහා බදු ආදායම පූර්ව වර්ෂයට සාපේක්ෂව රු.3,072,607,818 කින් වැඩිවීම හා රජයේ පුනරාවර්ථන ප්‍රදාන ලැබීම් රු.13,716,562,590 කින් වැඩිවීම හේතුවී තිබුණි.

## 3 කාර්ය මණ්ඩල පරිපාලනය

### 3.1 පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා වෙනත්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටි හා රීති සංග්‍රහයේ XXIII පරිච්ඡේදයේ 192(I)(III)(V) වගන්තිය ප්‍රකාර නිලධරයෙකු කිසියම් සේවා ස්ථානයක සේවය කර ඇති කාල පරිච්ඡේදය සේවා ස්ථානවල පවත්නා නීත්‍යානුකූල අතිරේක මූල්‍යමය ප්‍රතිලාභ, වෙනත් ප්‍රතිලාභ හා වරප්‍රසාද පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධරයෙකු එකම සේවා ස්ථානයක දිගු කාලයක් අඛණ්ඩව සේවය කිරීම මඟින් හෝ එකම රාජකාරියක් දිගු කාලයක් අඛණ්ඩව ඉටු කිරීම මඟින් හෝ සිදුවිය හැකි විෂමාචාර ක්‍රියා වළකාලීම සඳහා වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්ති හා පරිපාටි සකස් කර ස්ථානමාරු ක්‍රියාත්මක කළ යුතු වුවත් බස්නාහිර පළාතේ සභා ලේකම් කාර්යාලයේ නිලධාරීන් 18 දෙනෙකු 2022 දෙසැම්බර් 31 දිනට වසර 05 ත් 30 ත් අතර කාලයක් ස්ථානමාරු වීමකින් තොරව එකම සේවා ස්ථානයේ සේවය කරමින් පැවතුණි. | 2000 අංක 07 දරන පළාත් සභා ලේකම් කාර්යාල කාර්යය මණ්ඩල ප්‍රඥප්තියට අනුව කටයුතු කරනු ලැබේ. | එකම සේවා ස්ථානයක දිගු කාලයක් අඛණ්ඩව සේවය කිරීම වැළැක්වීමට කටයුතු කළ යුතුය. |

### 3.2 පළාත් සභා ප්‍රඥප්ති මඟින් පිහිට වූ ආයතන

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලය සඳහා 2019 සැප්තැම්බර් 30 දිනැති කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක | රාජ්‍ය ප්‍රතිපත්තියක් වශයෙන් සියළු බඳවා ගැනීම් අත්හිටුවා ඇති බැවින්, බඳවා ගැනීම් සිදු | මණ්ඩලයේ කටයුතු පවත්වාගෙන යාමට ස්ථිර කාර්යය |

| | | | |
|---|---|---|---|
| | DMS/WP/0507 දරන ලිපිය මඟින් කාර්ය මණ්ඩලය අනුමත කර තිබූ නමුත් එම කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණු අතර වැඩ බලන, කොන්ත්‍රාත් පදනම හා තාවකාලික පදනම යටතේ සියළු නිලධාරීන් අනුයුක්ත කර තිබුණි. | කිරීමට නොහැකි වී ඇති බව. | මණ්ඩලයක් පැවතිය යුතුය. |
| (ආ) | බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ කොළඹ අංක - 01 ප්‍රාදේශීය කාර්යාලය යටතේ ඇති බැස්ටියන් මාවත බස්නැවතුම්පළ 2009 ජූනි 20 දින සිට ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත පවරා දුන් පසුව සමාලෝචිත වර්ෂය දක්වා බස් නැවතුම්පළෙන් අධිකාරියට කිසිදු ආදායමක් නොලැබුණද එහි සේවය කරනු ලබන කාර්ය මණ්ඩලයේ 30 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා වශයෙන් රු.31,273,010 ක් අධිකාරිය විසින් ගෙවා තිබුණි. තවද එම කාර්ය මණ්ඩලයට 2009 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා වැටුප් හා දීමනා ලෙස ගෙවා ඇති මුදල රු.314,297,289 ක් විය. | අධිකාරිය මගින් වැටුප් හා දීමනා ලෙස දරන ලද මුදල් ප්‍රතිපූර්ණය කර දෙන ලෙස 2022 නොවැම්බර් 30 දිනැතිව ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙතින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඊට පිළිතුරු එවා ඇති අතර, ඉදිරි තීරණයන් ගැනීමට කටයුතු කරනු ඇත. | කාර්යය මණ්ඩල වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | විවිධ ව්‍යාපෘති හා කාර්යයන් සඳහා අනුමත කාර්ය මණ්ඩලයට අමතරව අධිකාරිය විසින් තදුචිත පදනම යටතේ සේවකයින් 362 ක් හා කොන්ත්‍රාත් පදනම යටතේ සේවකයින් 153 ක් වශයෙන් අධිකාරියේ කටයුතු සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් 515 ක් සේවයේ යොදවාගෙන තිබුණු අතර මිනිස්බල සැලැස්මක් සකස්කර එයට අනුව කාර්ය මණ්ඩලයට අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අධිකාරියේ අනියම් හා කොන්ත්‍රාත් සේවකයින් ස්ථිර කරගැනීම සඳහා අප විසින් 2014 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ගත් උත්සාහයන් සියල්ල ව්‍යර්ථ විය. | ගිණුම්කාරක සභා නියෝග ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.3 පාසැල් කාර්ය මණ්ඩලය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බස්නාහිර පළාතට අයත් කොළඹ, ගම්පහ හා කළුතර දිස්ත්‍රික්ක 03 හි පිහිටි පාසල්වල අධ්‍යාපන පරිපාලන සේවයේ විදුහල්පතිවරුන් 20 ක්, විදුහල්පති සේවයේ විදුහල්පතිවරුන් 262 ක්, නියෝජ්‍ය විදුහල්පතිවරුන් 256 ක්, සහකාර විදුහල්පතිවරුන් 47 ක් හා ගුරු සේවයේ නිලධාරීන් 1,893 ක් පුරප්පාඩුව පැවතුණි. | මෙම පුරප්පාඩු සම්බන්ධව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) දැනුවත් කර ඇත. | පුරප්පාඩු සඳහා බඳවා ගන්නා තෙක් පාසල් පද්ධතිය කළමනාකරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 සෞඛ්‍ය කාර්ය මණ්ඩලය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බදුරලිය ප්‍රාදේශීය රෝහලේ ස්ථානභාර වෛද්‍ය නිලධාරි තනතුර (MOIC) වසර ගණනාවක සිට පුරප්පාඩු වී පවතින අතර ප්‍රධාන හෙද නිලධාරිනිය ඇතුළු හෙද නිලධාරීන් 13 දෙනකු වසර 13 - 27 දක්වා කාල පරිච්ඡේදයක සිටත්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියක් වසර 16 ක කාලයක සිටත්, උපස්ථායකයන් දෙදෙනකු වසර 10-15 ක කාලයක සිටත් ස්ථාන මාරු නොලබා එම රෝහලේම අඛණ්ඩව සේවය කරමින් පැවතුණි. | 2023 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරුවලදී සේවා කාලය පදනම් කර ගනිමින් ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව නියමිත කාලය සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම්වලට යටත් විය යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 සැලසුම් කිරීම

**ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව සෑම ආයතනයක්ම තම ආයතනය වෙනුවෙන් සෑම වර්ෂයක් සඳහාම අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලස්මක් සකස් කළ යුතු අතර ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර සකස් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ප්‍රධාන ලේකම් කාර්යාලයේ අංශ විසින් වෙන වෙනම ක්‍රියාකාරී සැලසුම් සකස් කර තිබුණි. එය එක් වෙළුමක් ලෙස සකස් කිරීමට කාලයක් ගතවූ බැවින් නිශ්චිත දිනට ලබාදීමට නොහැකි විය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |